සටහන

2026 අප්‍රේල් - ජූනි

45 වෙළුම 4 - 6 කලාපය

මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් සහ තොරතුරු ආරක්ෂණය කෙරෙහි මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම

රටේ ආර්ථික ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

නිවැරදි ආයෝජන තීරණ සාර්ථක අනාගතයක පදනමයි

ඩිජිටල් ගෙවීම් වර්ධනය කිරීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස මූල්‍ය තාක්ෂණයේ (ෆින්ටෙක්) භාවිතය

රු. 80/-

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

ISSN 1391-3697

මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් සහ තොරතුරු ආරක්ෂණය කෙරෙහි මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම

අමාලි ප්‍රියශාන්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ

හරිනි ශෙනායා
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ

ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව

මූල්‍ය අන්තර්ගතභාවය, මූල්‍ය සාක්ෂරතාව වැනි ඉතාමත් ජනප්‍රිය සංකල්ප අතර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය ද දශකයකට වඩා වැඩි කාලයක් ලොව පුරා අවධානය යොමු වූ සංකල්පයකි. මූල්‍ය පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකීම සඳහා වන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් ජී20 කණ්ඩායමට අයත් රටවල් හා ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන සංවිධානයට (OECD) අයත් රටවල් එක් ව පිළිගත් හා ඔවුන් අනුගමනය කරනු ලබන මූලධර්ම 12ක් ඇත. ඒ අතුරින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම හා මූල්‍ය පාරිභෝගික දත්ත හා පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම වැදගත් මූලධර්ම දෙකක් වේ.

දෛනික ජීවිතයේ විවිධ වූ මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍ය ආයතන හා එක් ව කටයුතු කරන පුද්ගලයෝ තමන් සතු වත්කම් මෙන් ම තමන් පිළිබඳ වැදගත් තොරතුරු ද අදාළ මූල්‍ය ආයතන වෙත ලබා දෙති. මෙම වත්කම් හා තොරතුරු මූල්‍යමය වටිනාකමකින් යුක්ත වන බැවින් සිය පාරිභෝගිකයින්ගේ වත්කම් හා තොරතුරු සම්බන්ධ ව මූල්‍ය ආයතන සුපරික්ෂාකාරී ව හා විශ්වසනීයත්වයෙන් යුතු ව කටයුතු කළ යුතු ය. මෙසේ කටයුතු කිරීම මූල්‍ය සේවා සපයන ආයතනවල වගකීමකි. ඒ අනුව මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් හා තොරතුරු සම්බන්ධ ව මූල්‍ය සේවා සපයන ආයතනයක් කෙසේ කටයුතු කළ යුතු ද යන්න පැහැදිලි කිරීම මෙම ලිපියෙහි අරමුණයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහ බැංකුවේ නියාමනය යටතේ ඇති මූල්‍ය සේවා සපයන්නන් විසින් 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළේ ය.

මූල්‍ය සේවා සපයන්නා (මූල්‍ය ආයතනය) යනු★: බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන, බලයලත් ප්‍රාථමික වෙළෙඳුන්, බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, ගෙවීම් හා පියවීම් පද්ධතියේ සහභාගිකරුවන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ අනුමැතිය ලත් වෙනත් ඕනෑ ම ආකාරයක මූල්‍ය සේවා සපයන්නෙකි.

මූල්‍ය පාරිභෝගිකයා යනු★: මූල්‍ය සේවා සපයන්නන් හැර මූල්‍ය සේවා සපයන්නන් විසින් සපයනු ලබන ඕනෑම නිපැයුමක් හෝ සේවාවක් භාවිත කරන, භාවිත කර ඇති හෝ භාවිත කිරීමට හැකියාව ඇති පුද්ගලයෙක් හෝ ආයතනයක් හෝ නීතිමය ආයතනයක් හෝ එවැනි පාරිභෝගිකයෙකුගේ අවසර ලත් නියෝජිතයෙකි.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය යනු★: පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කිරීම, දැනුම්වත් මූල්‍ය තීරණ ගැනීමට පාරිභෝගිකයින්ට හැකියාව ලබා දීම සහ මූල්‍ය සේවා සපයන්නෙකු මගින් නිපැයුම් සහ සේවා සැපයීමේ දී සාධාරණත්වය සහතික කිරීම සඳහා වන නීති, රෙගුලාසි, චක්‍රලේඛ, නියෝග, මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති සහ ආයතන යන සමස්තයේ එකතුවයි.

★ 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි අනුව නිර්වචන සියල්ල ඉදිරිපත් කර ඇත.

රූප සටහන 01: **මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් හා තොරතුරු සම්බන්ධ ව මූල්‍ය සේවා සපයන ආයතනයක වගකීම**

මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් සහ තොරතුරු ආරක්ෂණය කෙරෙහි මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම

මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන ආයතනයක වගකීම

- මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් වංචා නොකිරීම හා අයථා ලෙස පරිහරණය නොකිරීම
- මූල්‍ය අලාභ සම්බන්ධ වගකීම
- වංචාවලට සම්බන්ධ පුද්ගලයින්ට විරුද්ධ ව කටයුතු කිරීම
- මූල්‍ය පාරිභෝගිකයින් දැනුම්වත් කිරීම

පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන ආයතනයක වගකීම

- මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික දත්ත රැස් කිරීම
- මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික දත්ත භාවිතය
- මූල්‍ය පාරිභෝගික පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම
- මූල්‍ය පාරිභෝගිකයින්ට තම පෞද්ගලික තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ නිවැරදි කිරීමට ඇති අයිතිය

මූල්‍ය වත්කම් හා සම්බන්ධ වංචා වැළැක්වීම හා පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම යන දෙඅංශය සම්බන්ධ ව මූල්‍ය ආයතනයක් කෙසේ කටයුතු කළ යුතු ද යන්න අපි වෙන වෙන ම සලකා බලමු.

1. මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන ආයතනයක වගකීම

1.1. මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් වංචා නොකිරීම හා අයථා ලෙස පරිහරණය නොකිරීම

මූල්‍ය පාරිභෝගිකයකු විසින් මූල්‍ය සේවාවක් ලබා ගැනීමේ දී ඊට අදාළ ව තම ආයතනය භාරයේ තබන මුදල් හෝ වෙනත් භෞතික වත්කමක් මූල්‍ය සේවා සපයන ආයතනයක් විසින් කිසි ම අයුරකින් වංචා නොකළ යුතු ය. ඒවා අයථා අයුරින් පරිහරණය නොකළ යුතු ය.

1.2. මූල්‍ය අලාභ සම්බන්ධ වගකීම

ඕනෑම පුද්ගලයෙකුට එදිනෙදා කටයුතුවල දී මූල්‍ය අලාභවලට මුහුණ දීමට සිදු විය හැකි ය. තමන්ගේ නොසැලකිල්ල හෝ තමන්ගේ ක්‍රියාකලාපය ඇතැම්

මූල්‍ය අලාභ සඳහා හේතු විය හැකි ය. නොඑසේ නම්, වෙනත් බාහිර හේතුවක් නිසා වුව ද මූල්‍ය අලාභවලට මුහුණ දීමට සිදු විය හැකි ය. නිදසුනක් ලෙස මූල්‍ය සේවාව සපයනු ලබන ආයතනයේ අකටයුතුකමක් හෝ ක්‍රියාකලාපයක් නිසා මූල්‍ය අලාභයක් ඇති විය හැකි ය.

මූල්‍ය ආයතනයක් සිය පාරිභෝගිකයෙකු තමන් සතු ව තබා ඇති වත්කම් වංචා කර හෝ අයථා අයුරින් පරිහරණය කිරීමක් නිසා මූල්‍ය අලාභයක් ඇති වී ඇත්නම් එම මූල්‍ය අලාභය සඳහා සම්පූර්ණ වගකීම අදාළ මූල්‍ය ආයතනය සතු වේ.

1.3. වංචාවලට සම්බන්ධ පුද්ගලයින්ට විරුද්ධ ව කටයුතු කිරීම

සිය ආයතනයේ සේවකයෙකු හෝ කිහිප දෙනෙකු ගනුදෙනුකරුවන්ගේ වත්කම් වංචනික ලෙස පරිහරණය කර ඇත්නම් හෝ එම වත්කම් යොදා ගෙන වංචාවක් සිදු කර ඇත්නම් අදාළ සේවකයින්ට විරුද්ධ ව කඩිනමින් විනය ක්‍රියාමාර්ග ගැනීමට එම ආයතනයේ කළමනාකාරිත්වය කටයුතු කළ යුතු ය. එසේ ම ඒ සම්බන්ධ ව මහ බැංකුවේ අදාළ නියාමන දෙපාර්තමේන්තුවට ද දැනුම් දිය යුතු ය.

නිදසුනක් ලෙස යම් බැංකුවක සේවකයෙකු පාරිභෝගික වත්කම් හා සම්බන්ධ විනය විරෝධී කටයුත්තකට සම්බන්ධ වී ඇත්නම් ඒ පිළිබඳ ව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු ය. මූල්‍ය සමාගමක් හා සම්බන්ධ වංචාවක් නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ පිළිබඳ ව දැනුම් දිය යුතු ය.

1.4. මූල්‍ය පාරිභෝගිකයින් දැනුම්වත් කිරීම

මූල්‍ය ගනුදෙනු සිදු කළ හැකි ආකාරය, ඒවා හා සම්බන්ධ නීතිමය පසුබිම ආදි තොරතුරු පිළිබඳ ව නොදන්නා පාරිභෝගිකයින් පහසුවෙන් මූල්‍ය වංචාවලට ගොදුරු විය හැකි ය. එම නිසා මූල්‍ය වංචා ඇති විය හැකි ආකාර, ඒවා සම්බන්ධයෙන් මූල්‍ය පාරිභෝගිකයින්ගේ වගකීම හා එවැනි වංචාවල ගොදුරක් නොවී සිටීමට ගත යුතු පියවර පිළිබඳ ව නිරතුරුව ම මූල්‍ය පාරිභෝගිකයින් දැනුම්වත් කිරීමේ වගකීම ද මූල්‍ය ආයතන සතු වේ. මේ සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන්, දැන්වීම්, නිවේදන, හඬපට, වීඩියෝපට ආදිය උපයෝගී කර ගත හැකි ය.

2. පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන ආයතනයක වගකීම

මූල්‍ය පාරිභෝගික දත්ත සම්බන්ධයෙන් 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත හා ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි අදාළ වේ. දත්ත රැස් කිරීම, දත්ත භාවිතය, ආරක්ෂණය හා හෙළිදරව් කිරීම යන අංශ මේවා තුළින් ප්‍රධාන වශයෙන් ආවරණය වී ඇත.

2.1. මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික දත්ත රැස් කිරීම

මූල්‍ය ආයතනයක් සිය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු රැස් කිරීමේ දී පහත දෑ සැලකිල්ලට ගත යුතු ය.

- **නීත්‍යානුකූල ව තොරතුරු රැස් කළ යුතු ය:** මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගිකයාගේ පෞද්ගලික තොරතුරු රැස් කළ යුත්තේ නිශ්චිත (specified), පැහැදිලි (explicit) හා නීත්‍යානුකූල (legitimate) අරමුණක් වෙනුවෙන් පමණකි. එහි දී අදාළ නියාමන ආයතන විසින් නිකුත් කළ නීතියක්, විධායනයක් හෝ මාර්ගෝපදේශයක් තිබිය යුතු ය.

- **තොරතුරු රැස් කිරීමට අදාළ ව ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි තිබිය යුතු ය:** ඉහත සඳහන් කළ ආකාරයට යම් නීතියක්, විධානයක් හෝ මාර්ගෙ ෝපදේශයක් යටතේ තොරතුරු රැස් කරන්නේ නම් එසේ රැස් කරන තොරතුරුවල මාධ්‍යය, අරමුණ සහ කිනම් තොරතුරු රැස් කරන්නේ ද යන්නත් එම තොරතුරු භාවිත කරන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මූල්‍ය ආයතනයක් සතු විය යුතු ය.

- **අනෙකුත් නීතිවලට අනුකූල වීම:** ඉහත නීතිවලට අමතරව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සහ පෞද්ගලික දත්ත ආරක්ෂණය ඇතුළු අප රටේ

බලපැවැත්වෙන වෙනත් නීතිවලට අවශ්‍ය ඇතැම් තොරතුරු ද මූල්‍ය ආයතන විසින් රැස් කළ යුතු වේ. ඒ අනුව මූල්‍ය ආයතන විසින් තම පාරිභෝගිකයින් වෙතින් ඒවා ලබා ගෙන රඳවා තබා ගත යුතු ය.

2.2. මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික දත්ත භාවිතය

පෞද්ගලික තොරතුරු රැස් කිරීම මෙන් ම ඒවා භාවිත කිරීම හා සම්බන්ධ ව ද මූල්‍ය ආයතනයක් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග වේ.

❖ **දත්ත නිශ්චිත අරමුණ වෙනුවෙන් පමණක් භාවිත කළ යුතු ය:** මූල්‍ය පාරිභෝගික තොරතුරු රැස් කරන්නේ නිශ්චිත අරමුණක් සඳහා වන බැවින් රැස් කරනා දත්ත එකී අරමුණ උදෙසා පමණක් භාවිත කළ යුතු ය. වෙනත් අරමුණු සඳහා එම දත්ත භාවිත කළ නොහැකි ය. එසේ ම ඒවායේ රහස්‍යභාවය සෑම විටම සුරැකිය යුතු ය.

නමුත් මූල්‍ය පාරිභෝගිකයාගේ කැමැත්ත සහිත ව වෙනත් අරමුණක් සඳහා ඇතැම් තොරතුරු භාවිතා කිරීමට හෝ හෙළිදරව් කිරීමට මූල්‍ය ආයතනයකට පුළුවනි.

❖ **විශේෂ අවශ්‍යතා පිළිබඳ පෞද්ගලික තොරතුරු:** මූල්‍ය සේවා ලබා ගන්නා ඇතැම් පුද්ගලයින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් විය හැකි ය. එනම් විශේෂ ආබාධිත තත්ත්වයකින් පෙළෙන්නෙකු විය හැකි ය. එවැනි විටෙක දී එවැනි පුද්ගලයින්ගේ පෞද්ගලික තොරතුරුවලට අදාළ වන වෙන ම නීතිරීති සමූහයක් ඇත.

තමන්ගේ විශේෂ අවශ්‍යතාව පිළිබඳ තොරතුරු මූල්‍ය ආයතනය වෙත ලබා දීමේ හෝ ලබා නොදීමේ තීරණය මූල්‍ය පාරිභෝගිකයා සතු වේ. විශේෂ අවශ්‍යතාව පිළිබඳ තොරතුරු මූල්‍ය පාරිභෝගිකයා විසින් මූල්‍ය ආයතනය වෙත සිය කැමැත්තෙන් ලබා දී ඇති විටෙක එම තොරතුරු භාවිත කළ යුත්තේ මූල්‍ය පාරිභෝගිකයාට පහසුකම් සැලසීම හෝ මූල්‍ය පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පමණකි. ඒ හැර වෙනත් කිසිදු අරමුණක් සඳහා මූල්‍ය ආයතනය විසින් මූල්‍ය පාරිභෝගිකයාගේ විශේෂ අවශ්‍යතා පිළිබඳ තොරතුරු භාවිත නොකළ යුතු ය. එමෙන් ම මූල්‍ය පාරිභෝගිකයාගේ පූර්ව අවසරයකින් තොරව එම ආබාධිතභාවය/විශේෂ අවශ්‍යතාව පිළිබඳ තොරතුරු වෙනත් කිසිදු පාර්ශ්වයකට හෙළි නොකළ යුතු ය.

2.3. මූල්‍ය පාරිභෝගික පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම

❖ **තොරතුරු ආරක්ෂණය:** මූල්‍ය ආයතන විසින් තමන් එක් රැස් කර ඇති මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු නිසි අයුරින් ආරක්ෂා කළ යුතු ය. ඒවා නීත්‍යනුකූල නොවන අයුරින් නැවත සැකසීමට හෝ වෙනස් කිරීමට මූල්‍ය ආයතනයකට නොහැකි ය. අවසර නොමැති පුද්ගලයින් පාරිභෝගික දත්ත වෙත ප්‍රවේශ වීම වළකාලිය යුතු ය. ඒ අනුව පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය (Confidentiality), ආරක්ෂාව (Security) සහ සුපිළිපන්බව (integrity) තහවුරු කිරීම සඳහා පහත පියවර මූල්‍ය ආයතනයක් විසින් ගත යුතු ය.

- **ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම:** මූල්‍ය ආයතන විසින් සිය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය, ආරක්ෂාව සහ සුපිළිපන්භාවය පවත්වාගෙන යන බවට සහතික වීම අත්‍යාවශ්‍ය ය. එබැවින් ඊට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සම්පාදනය කොට ඒවා නිසි අයුරින් ක්‍රියාත්මක කළ යුතු ය.

- **තොරතුරු අනිසි ලෙස භාවිත නොකරන බව තහවුරු කිරීම:** තමන් හෝ තම ආයතනයේ සේවය කරන කාර්ය මණ්ඩලය (තම ආයතනය වෙනුවෙන් කටයුතු කරන තුන්වන පාර්ශ්වයන් ද ඇතුළු ව) මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු අනිසි ලෙස භාවිත නොකරන බවට මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතු ය.

- **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම:** මූල්‍ය පාරිභෝගික දත්ත වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම, ඒවා වෙනස් කිරීම, වෙනත් පාර්ශ්වයකට හෙළිදරව් කිරීම, අහඹු ලෙස තොරතුරු නැතිවීම හෝ විනාශ කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය දත්ත ආරක්ෂණ පියවර ගත යුතු ය. එමෙන් ද ඒ සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතු ය.

❖ **දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහනක් තිබීම:** දත්ත ආරක්ෂණය සිදු කරන ආකාරය පිළිබඳ විස්තර මූල්‍ය ආයතනයක් විසින් ලේඛනගත කර තිබිය යුතු ය. මෙයට අභ්‍යන්තර අධීක්ෂණ

කටයුතු සිදු කරන ආකාරය ද යම් පැමිණිල්ලක් සිදු කරන අවස්ථාවක ඒ හා සම්බන්ධ ව කටයුතු කරන ආකාරය ද ඇතුළත් විය යුතු ය. මෙහි අරමුණ දත්ත හිමිකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීමයි.

යම් ලෙසකින් මූල්‍ය පාරිභෝගිකයෙකු තමන්ගේ තොරතුරු නිසි අයුරින් ආරක්ෂා වී නොමැති බව දැන ගතහොත් ඔහුට අදාළ මූල්‍ය ආයතනය වෙත සෘජුව ම ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි ය. ඊට අදාළ හේතු සාධාරණ කාලයක් තුළ මූල්‍ය ආයතනය විසින් මූල්‍ය පාරිභෝගිකයා වෙත ලබා දිය යුතු ය.

❖ **ගිවිසුම් කාලය ඉකුත් වීමෙන් පසුව ද තොරතුරු ආරක්ෂා කිරීම:** සෑම ගනුදෙනුවකට අදාළ ව ම ගිවිසුම් කාලයක් ඇත. එම ගිවිසුම්ගත කාලය අවසන් වීමෙන් පසු ව අවම වශයෙන් වසර හයක කාලයක් එම තොරතුරු සුරක්ෂිත කොට තබා ගත යුතු ය. මූලාශ්‍ර ලේඛන, ප්‍රධාන තොරතුරු, ගිවිසුම්ගත ලේඛන සහ සියලු ම ගනුදෙනුවල ඉතිහාසය යනාදිය මෙසේ සුරක්ෂිත ව තබා ගත යුතු වේ.

මෙම අවශ්‍යතාව සමහර නීති අනුව වෙනස් විය හැකි ය. නිදසුනක් ලෙස 2016 අංක 12 දරන තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ලිපි ලේඛන වසර 12ක් සුරක්ෂිත කළ යුතු ය, එසේ ම සංඛ්‍යානමය පර්යේෂණ සිදු කිරීමට අවශ්‍ය ව ඇති විටෙක ද මෙම රඳවා තබා ගැනීමේ කාලය වෙනස් විය හැකි ය.

❖ **තෙවන පාර්ශ්වයක් සමඟ තොරතුරු හුවමාරු නොකිරීම:** මූල්‍ය පාරිභෝගිකයාගේ කැමැත්ත ලබා දී ඇති අවස්ථාවක හෝ නීතිමය තත්ත්වයක් යටතේ තොරතුරු ලබා දීමට බැඳී සිටින අවස්ථාවක හැර, මූල්‍ය පාරිභෝගිකයාගේ පෞද්ගලික තොරතුරු කිසිදු තෙවන පාර්ශ්වයකට අනාවරණ නොකළ යුතු ය.

❖ **දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කිරීම:** රජයේ ආයතනවල හා මහ බැංකුව මගින් අධීක්ෂණ කටයුතු සිදු කරන මූල්‍ය ආයතනවල දත්ත ආරක්ෂණ නිලධාරියෙකු සිටිට යුතු ය.

2.4. මූල්‍ය පාරිභෝගිකයින්ට තම පෞද්ගලික තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ නිවැරදි කිරීමට ඇති අයිතිය

❖ **මූල්‍ය පාරිභෝගිකයාට තොරතුරු ලබා දීම:** මූල්‍ය පාරිභෝගිකයෙකු ඉල්ලීමක් කළ විට, මූල්‍ය ආයතනය විසින් ඔහු පිළිබඳ ව තමන් සතු ඕනෑ ම පෞද්ගලික තොරතුරක් ඔහුට ලබා දිය යුතු ය. මෙහි දී එම තොරතුරු මූල්‍ය පාරිභෝගිකයාට තේරුම් ගත හැකි අයුරින් සාධාරණ කාලයක් තුළ ලබා දීමට මූල්‍ය ආයතනය බැඳී සිටී.

මූල්‍ය ආයතන විසින් ඇතැම් තොරතුරු ගාස්තු අය කිරීමකින් තොර ව ලබා දෙනු ලැබේ. නමුත් ඇතැම් තොරතුරු ලබා දීමේ දී ඒ සඳහා ගාස්තුවක් අය කරයි. යම් ගාස්තුවක් අය කරන්නේ නම් එහි පිරිවැය අවම විය යුතු ය.

නිදසුනක් ලෙස රඳවා ගැනීමේ බදු පිළිබඳ විස්තර ලබා දීමේ දී ගාස්තු අය නොකරන අතර වීසා ලබා ගැනීම වෙනුවෙන් නිකුත් කරන ශේෂ තහවුරු කිරීම් සඳහා ගාස්තු අය කරනු ලැබේ.

❖ **තොරතුරු නිවැරදි හා යාවත්කාලීන විය යුතු ය:** මූල්‍ය පාරිභෝකයින්ගේ තොරතුරු කලින්කලට වෙනස් විය හැකි ය. තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කිරීම පිණිස එවැනි අවස්ථාවල දී දත්ත යාවත්කාලීන කිරීමේ පහසුකම මූල්‍ය ආයතන විසින් සැපයිය යුතු ය.

මූල්‍ය ආයතනය සතුව ඇති ඕනෑ ම පෞද්ගලික දත්තයක් සාවද්‍ය හෝ අසම්පූර්ණ බව මූල්‍ය පාරිභෝගිකයෙකු ප්‍රකාශ කරයි නම් එවැනි අවස්ථාවක, මූල්‍ය ආයතනය විසින් සාධාරණ කාලයක් තුළ එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය. එසේ ම යම් හෙයකින් මීට පෙර එම තොරතුරු තෙවන පාර්ශ්වයක් හා හුවමාරු කර ගෙන ඇත්නම් නිවැරදි තොරතුරු නැවත ඔවුන්ට දැනුම් දීමට ද පියවර ගත යුතු ය.

තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා පහසු ක්‍රමවේදයක් ආයතන තුළ ස්ථාපිත කර ඒ බව සිය පාරිභෝගිකයින්ට දැනුම් දීම ද මූල්‍ය ආයතනයක් විසින් සිදු කළ යුත්තකි. නිදසුනක් ලෙස ඩිජිටල් ගනුදෙනුවලට අදාළ විද්‍යුත් තැපෑල මගින් තොරතුරු දැනුම් දීමේ පහසුකම ලබා දිය හැකි ය. නැතහොත් මූල්‍ය ආයතනයට පැමිණ තොරතුරු යාවත්කාලීන කිරීමේ පත්‍රිකා පුරවා භාර දිය හැකි ය.

වගුව 01: මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් හා තොරතුරු සම්බන්ධ ව මූල්‍ය සේවා සපයන ආයතන සතු වගකීම දැක්වෙන නීති හා රෙගුලාසි

පනත/ රෙගුලාසිය	ආවරණය
2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත	පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළ ව දත්ත දායකයින්ගේ අයිතිවාසිකම් හඳුනා ගැනීම හා ශක්තිමත් කිරීම පිණිස එනම් පෞද්ගලික දත්ත රැස් කිරීම, භාවිතය, ආරක්ෂණය හා හෙළිදරව් කිරීම සම්බන්ධ නෛතික රාමුවක් සැලසීම.
1988 අංක 30 දරන බැංකු පනත හා 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත	සෑම තරාතිරමක ම නිලධාරින් විසින් බැංකු ගිණුමක් පවත්වා ගෙන යන ගනුදෙනුකරුවන්ගේ ගිණුම් පිළිබඳ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරන බව තහවුරු කිරීම.
2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත	සෑම තරාතිරමක ම නිලධාරින් විසින් මුදල් සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති මූල්‍ය ආයතනයක ගිණුමක් පවත්වා ගෙන යන ගනුදෙනුකරුවන්ගේ ගිණුම් පිළිබඳ තොරතුරුවල පූර්ණ රහස්‍යභාවය ආරක්ෂා කරන බව තහවුරු කිරීම.
2000 අංක 56 දරන කල්බදු සමාගම් පනත	සෑම තරාතිරමක ම නිලධාරින් විසින් කල්බදු සමාගමක් සතු ඕනෑ ම තොරතුරක් හෙළිදරව් නොකිරීම.
2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි	පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ ව මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින සියලු ම මූල්‍ය සේවා සපයන්නන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි නිවේදනය කිරීම.

ඉහත සඳහන් ආකාරයට කටයුතු නොකරන ඕනෑ ම මූල්‍ය ආයතනයකට එරෙහි ව මහ බැංකුව වෙත සිය පැමිණිලි ඉදිරිපත් කිරීමට මූල්‍ය පාරිභෝගිකයින්ට හැකියාව ඇත. අදාළ ආයතන සම්බන්ධීකරණය කොට ඊට අදාළ සුදුසු පියවර ගැනීමට මහ බැංකුව කටයුතු කරයි.

කෙසේ වුව ද සිය මූල්‍ය වත්කම් හා තොරතුරු ආරක්ෂා කර ගැනීමෙහි ලා මූල්‍ය පාරිභෝගිකයින්ට ද වගකීමක් ඇත. වැරදි තොරතුරක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක ඒ පිළිබඳ දැනගත් විගස ඒවා නිවැරදි කිරීමටත් තොරතුරුවල වෙනසක් සිදු වන ඕනෑම අවස්ථාවක ඒවා නිවැරදි කිරීමටත් මූල්‍ය පාරිභෝගිකයින් කටයුතු කළ යුතු ය.

07 සංවාද සටහන

රටේ ආර්ථික ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

අපේ රටේ ආර්ථිකයේ ස්ථාවරත්වය උදෙසා කැපවන ආර්ථිකයේ හදවත බඳු වූ ස්ථානය ශ්‍රී ලංකා මහ බැංකුවයි.

2023 වසරේ බලාත්මක කරන ලද අංක 16 දරන නව මහ බැංකු පනතත් සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යභාරය යම් තරමක වෙනස් වීමකට ලක් වූ අතර, එහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ ලෙස ආර්ථිකයේ මිල ස්ථායීතාව අත්පත් කර ගැනීම සහ පවත්වා ගැනීමත් අනෙක් අරමුණ ලෙස මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීමත් හඳුනා ගැනුණා.

ඔබට නිරන්තරයෙන් අසන්නට ලැබෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික කාර්යභාරය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය යශෝධා සේනාධීර මහත්මිය සහ එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජානක එදිරිසිංහ මහතා සමඟ සිදු කළ සාකච්ඡාවකි මේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂතුමනි අපේ රටේ ආර්ථික ස්ථාවරත්වය උදෙසා මහ බැංකුවේ භූමිකාව මොන ආකාරයේ ද?

ශ්‍රී ලංකා මහ බැංකුව 1950 වසරේ දී ආරම්භ කර මේ වනවිට අවුරුදු 75ක් සම්පූර්ණ වී තිබෙනවා. 2023 වසර වනවිට අලුත් මහ බැංකු පනතකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු යම් ආකාරය වෙනස් වීමකට ලක් වෙලා තමයි වර්තමානයේ දී ක්‍රියාත්මක වන්නේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ විදිහට අපි හඳුනා ගන්නේ මිල ස්ථායීතාව ළඟාකර ගැනීම සහ පවත්වා ගැනීම. ආර්ථිකයේ මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ බලය මහ බැංකුවට නෛතික වශයෙන් පැවරිලා තිබෙනවා. මහ බැංකුව රටේ ආර්ථිකයට දායක වන්නේ මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම හරහා. මේ මිල ස්ථායීතාව කියන්නේ, අපි බලාපොරොත්තු වන ඉහළ ආර්ථික වර්ධනය වගේම සෞභාග්‍යමත් හෙට දවසක් වෙනුවෙන් වන ආර්ථිකයේ අත්‍යවශ්‍ය කාරණයක්. මහ බැංකුවේ ප්‍රමුඛතම අරමුණක් ලෙසට මිල ස්ථායීතාව පවත්වා ගැනීම හඳුනාගෙන තිබෙනවා. මේ සමගම එකට බැඳුණු අනෙක් අරමුණ තමයි මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම. ආර්ථිකය වෙනුවෙන් මිල ස්ථායීතාව වගේම මූල්‍ය පද්ධති ස්ථායීතාව ළඟාකර දීමට මහ බැංකු පනතෙන් මහ බැංකුවට බලය ලබා දී තිබෙනවා. ඒ හරහා තමයි ආර්ථිකයේ අනෙකුත් කොටස්කරුවන්ට ආර්ථිකයේ වර්ධනයට දායක විය හැකි පරිසරයක් නිර්මාණය කරන්නේ.

ජානක මහත්මයා, උද්ධමනය කියන සංකල්පය අපේ රටේ බොහෝ විට කතාබහට ලක්වන මාතෘකාවක්. උද්ධමනය සහ මිල ස්ථායීතාව ගැන අප සැලකිලිමත් විය යුත්තේ ඇයි?

උද්ධමනය අඩු වුණා, උද්ධමනය වැඩි වුණා කියද්දී භාණ්ඩ හා සේවා මිල පැවති මට්ටමට වඩා අඩු වෙලා හෝ වැඩි වෙලා වැනි සරල අදහසක් තමයි මතකයට නැගෙන්නේ. නමුත් අපි නිවැරදිව වටහා ගත යුතුයි

උද්ධමනය යනුවෙන් අදහස් වන්නේ භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම පසුගිය වසරේ අදාළ කාල සීමාවට සාපේක්ෂව මෙම වසරේ දී කොපමණ ඉහළ ගොස් තිබේ ද යන කාරණාව. උද්ධමන වේගය යන්නෙන් අදහස් වන්නේ භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම කොපමණ වේගයකින් ඉහළ ගොස් තිබේ ද යන්න. මිල ස්ථායීතාව හඳුනාගන්න භාවිත කරන්නේ උද්ධමනය අඩු සහ ස්ථායී මට්ටටමක පවත්වා ගැනීම. භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම වැඩිවන වේගය අඩු හා ස්ථායී මට්ටමක පවතින විට අපි කියනවා ආර්ථිකයේ මිල ස්ථායීතාව පවතිනවා කියලා. එහි වැදගත්කම වන්නේ, ආර්ථිකයක භාණ්ඩ හා සේවාවල මිල නිරන්තරයෙන් ඉහළ පහළ යන තත්ත්වයක් සැලකූ විට, ආයෝජකයෙක්, නිෂ්පාදකයෙක්, පාරිභෝගිකයෙක් ලෙස හෙට දවසේ මිල මට්ටමේ හැසිරීම නිශ්චය කිරීම අසීරුයි. එවිට අපි කියනවා ආර්ථිකයේ මිල ස්ථායීතාව බිඳ වැටිලා කියලා. යම්කිසි පුද්ගලයෙකු තමන්ගේ ආර්ථික තීරණයක් ගන්න විට මිලෙහි වෙනස් වීම ආර්ථික තීරණය සෘණාත්මකව බලපා තිබෙනවා නම් අපි කියනවා ආර්ථිකයේ මිල ස්ථායීතාවයේ බිඳ වැටීමක් පවතිනවා. මේ දෙක අතර වෙනස හඳුනාගැනීම ඉතා වැදගත්. මහ බැංකුවක කාර්යභාරය තමයි පොදු මිල මට්ටම ඉතා විශාල වශයෙන් වැඩි වීමකට ලක් නොවී ඔබට හෙට දවසේ උද්ධමනය පවතින මට්ටම පුරෝකථනය කළ හැකි අයුරින් පවත්වා ගෙන යෑම. ආර්ථිකයේ දත්ත දෙස අවධානය යොමු කරලා උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි විශ්වාස කරනවා නම් එය ආර්ථික තීරණ ගැනීම පහසු කරනවා. ආයෝජනය කරන්න පහසුයි. නිවැරදි ආර්ථික තීරණය ගැනීම සඳහා ඉතා හොඳ දැනුම්වත්භාවයක් හිමි වනවා. මිල ඉතා විශාල වශයෙන් උච්චාවචනය වන විට වැරදි ආයෝජන සිදු කිරීමට පෙළඹීම මගින් ආර්ථික තීරණ වැරදීමට ඉඩ තිබෙනවා. ඒ නිසා මිල ස්ථායීතාව පවත්වා ගැනීම ආර්ථිකයට අතිශයින්ම වැදගත්. ආර්ථිකයේ මිල ස්ථායීතාව කුටුම්බයක් ලෙස මහජනතාවටත් ආයතනයක් ලෙසත් රජයටත් ආර්ථිකයේ සෑම කොටස්කරුවෙකුටම එක සේ වැදගත් වෙනවා. මහ බැංකුව මිල ස්ථායීතාව කෙරෙහි මෙතරම් වැදගත්කමක් ලබා දීලා තමන්ගේ ප්‍රමුඛතම අරමුණ ලෙස පිළිගෙන කටයුතු කරන්නේ මේ හේතුවෙන්.

මේ මිල ස්ථායීතාව පවත්වා ගැනීමට ස්වාධීන මහ බැංකුවක් අවශ්‍යය ද? ඒ පිළිබඳ ව නියෝජ්‍ය අධ්‍යක්ෂතුමියගෙන් දැනගමු.

ඇත්තටම මිල ස්ථායීතාව පවත්වා ගෙන යෑමට ස්වාධීන මහ බැංකුව ඉතාම වැදගත් සාධකයක්. මිල ස්ථායීතාව පවත්වාගෙන යෑමට අපි යොදා ගන්නේ මුදල් ප්‍රතිපත්තිය. ප්‍රධාන වශයෙන් දේශපාලන බලපෑම්වලින් තොර ව මේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුයි. රජයක් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කරන කොට අපිට දකින්න ලැබෙනවා විශේෂයෙන් දේශපාලන අරමුණු මත පදනම් වෙලා බොහොම කෙටි කාලයක් පිළිබඳ ව පමණක් සලකා බලා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම. නිදසුන් විදිහට, මැතිවරණයක් ආසන්න වන විට පොලී අනුපාතික අඩු මට්ටමක පවත්වා ගෙන ඒ හරහා ආර්ථික කටයුතු වේගවත් කරන්න රජයක් උත්සාහ කරන්න පුළුවන්. එහෙමත් නැත්නම් මැතිවරණ පොරොන්දු ඉටු කිරීම සඳහා පොලී අනුපාතික අඩු මට්ටමක පවත්වා ගැනීමට, එහෙමත් නැත්නම් විනිමය අනුපාතික ස්ථාවර ව තබා ගන්න උත්සාහ කරන්න පුළුවන්. කෙටි කාලීන අරමුණු මත පදනම් වෙලා ප්‍රතිපත්ති තීරණ ගත්තොත් මැදි කාලීනව සහ දිගු කාලීනව උද්ධමනකාරී තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. නිදසුන් ලෙස දිගටම ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගැනිමට උත්සාහ කළොත් විදේශ සංචිත වැයවෙලා පසු කාලීනව ආර්ථික අස්ථාවර බවක් ඇති වෙන්න පුළුවන්. ඒ වගේම පොලී අනුපාතික අනවශ්‍ය ලෙස දිගු කාලීනව අඩු මට්ටමක පවත්වාගෙන යෑමෙන් මැදි කාලීනව හා දිගු කාලීනව උද්ධමනකාරී තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන විට නුදුරු කාලය ගැන පමණක් නෙවෙයි මැදි කාලීනව මෙන්ම දිගු කාලීනව ඇති විය හැකි තත්ත්ව සහ ප්‍රවණතා පිළිබඳව සැලකිලිමත් විය යුතුයි. ඒ වගේම දේශපාලන බලපෑම්වලින් තොරව මුදල් ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගත යුතුයි. රජයක් විසින් මුදල් ප්‍රතිපත්තියට බලපෑම් කිරීම ලංකාවේ විතරක් නෙවෙයි සංවර්ධිත රටවල පවා දක්නට ලැබෙන තත්ත්වයක්. මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා ලෝකයේ බොහෝ රටවල් රජයේ භාණ්ඩාගාරය හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වෙනුවට ස්වාධීන මහ බැංකුවක් පිහිටුවලා ඒ හරහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබෙනවා.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන විට නුදුරු කාලය ගැන පමණක් නෙවෙයි මැදි කාලීනව මෙන්ම දිගු කාලීනව ඇති විය හැකි තත්ත්ව සහ ප්‍රවණතා පිළිබඳව සැලකිලිමත් විය යුතුයි.

ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කරන්නේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක්. උද්ධමනය ඉලක්කගත මට්ටමේ පවත්වා ගෙන යෑමට නම් උද්ධමන අපේක්ෂා කළමනාකරණය කළ යුතුයි. මහ බැංකුව මේ උද්ධමනය, උද්ධමන ඉලක්කය ආසන්නයේ පවත්වාගෙන යන බව මහජනතාව වගේම ව්‍යාපාර විශ්වාස කරනවා නම් එවැනි අවස්ථාවල දී උද්ධමනය ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට මහ බැංකුවට ඉතා පහසුයි. මහ බැංකුවක් දේශපාලන බලපෑම්වලට යටත් වී ස්වාධීන නොවන අයුරින් කටයුතු කරනවා නම් මහ බැංකුවට උද්ධමනය ඉලක්කගත මට්ටමේ තබා ගත හැකි බවට මහජනතාව විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා මෙම උද්ධමන අපේක්ෂා කළමනාකරණය කර ගැනීම සඳහා මහ බැංකුව ස්වාධීනව කටයුතු කිරීම ඉතා වැදගත් වනවා.

ඒ වගේම රාජ්‍ය මූල්‍ය ඒකාධිපත්‍ය (Fiscal dominance) කියන තත්ත්වය ඇති වීම වළක්වා ගැනීම සඳහා ස්වාධීන මහ බැංකුවක් තිබීම ඉතාම වැදගත්. ශ්‍රී ලංකා මහ බැංකුව මීට පෙර පාලනය වුණේ මුදල් නීති පනත යටතේ. මුදල් නීති පනත යටතේ දී භාණ්ඩාගාර ලේකම්වරයා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයෙක්. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන භාණ්ඩාගාරයට මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියට සෘජුව ම බලපෑමක් ඇති කරන්න පුළුවන් වීම තමයි රාජ්‍ය මූල්‍ය ඒකාධිකාරිය කියලා කියන්නේ. රජයේ අයවැය හිඟය ඉතා විශාල වීම, රජයේ ණය ඉහළ මට්ටමක් ගැනීම වැනි අවස්ථාවල දී රජය බොහෝ විට මුදල් ප්‍රතිපත්තියට බලපෑමක් ඇතිකරන්න උත්සාහ කරනවා. පොලී අනුපාතික අඩු මට්ටමක පවත්වා ගැනීම, අඩු විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම වෙනුවෙන් බලපෑම් කරනවා. ඇතැම් අවස්ථාවල දී අයවැය හිඟය මුදල් අච්චු ගැසීමෙන් මහ බැංකුව හරහා පියවා ගැනීමට බලපෑම් ඇති කරන්න පුළුවන්. මෙය 2022 වසරට පෙර පැහැදිලිවම දක්නට ලැබුණු තත්ත්වයක්. 2021/22 වසරවලදී ගත්තොත් පොලී අනුපාතික අඩු මට්ටමක තබා ගැනීමට, විනිමය අනුපාතිකය අඩු මට්ටමක තබා ගැනීමට රජයට අවශ්‍ය වුණා. මහ බැංකුව හරහා අයවැය හිඟය මූල්‍යනය කරන්නත් විශාල වශයෙන් කටයුතු කෙරුණා. ඒ හේතුව නිසා තමයි 2022 වසර වනවිට අපට උද්ධමනය ඉතා ඉහළ අගයක් ගෙන අර්බුදකාරී තත්ත්වයක් ඇති වුණේ. ඒ තත්ත්වය නැවත ඇති වීම වළක්වා ගැනීමට මුදල් නීති පනත වෙනුවට නව මහ බැංකු පනත හඳුන්වා දුන්නා. මුදල් නීති පනත යටතේ භාණ්ඩාගාර ලේකම්වරයා මුදල් මණ්ඩලයේ සාමාජිකයෙක් වුණාට නව මහ බැංකු පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ භාණ්ඩාගාර ලේකම්වරයා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේවත් පාලක මණ්ඩලයේවත් සාමාජිකයෙක් බවට පත් වන්නේ නැහැ. ඒ ඔස්සේ භාණ්ඩාගාරය හරහා මහ බැංකුවට බලපෑමක් ඇති වීම වළක්වා ගෙන තිබෙනවා. ඒ වගේම ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ඉතාම හදිසි ආපද අවස්ථාවකදී හැර අයවැය හිඟය මූල්‍යනය මහ බැංකුව හරහා සිදු කිරීම සම්පූර්ණයෙන් නවත්වා තිබෙනවා. ඒ අනුව මහ බැංකු පනත යටතේ මහ බැංකුව ස්වාධීන වී තිබෙනවා.

නව මහ බැංකු පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ භාණ්ඩාගාර ලේකම්වරයා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේවත් පාලක මණ්ඩලයේවත් සාමාජිකයෙක් බවට පත් වන්නේ නැහැ. ඒ ඔස්සේ භාණ්ඩාගාරය හරහා මහ බැංකුවට බලපෑමක් ඇති වීම වළක්වා ගෙන තිබෙනවා. ඒ වගේම ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ඉතාම හදිසි ආපද අවස්ථාවකදී හැර අයවැය හිඟය මූල්‍යනය මහ බැංකුව හරහා සිදු කිරීම සම්පූර්ණයෙන් නවත්වා තිබෙනවා.

මෙහිදී විශේෂ දෙයක් සඳහන් කළ යුතුයි. මහ බැංකුව ස්වාධීන වීමත් සමඟ මහ බැංකුවේ වගවීම ඉහළ දැමීමටත් මහ බැංකු පනත මගින් කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන් ම මහ බැංකුව උද්ධමන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වුණොත් මහ බැංකුවට සිදු වෙනවා පාර්ලිමේන්තුවටත් මහජනතාවටත් වාර්තාවක් ඉදිරිපත් කරලා එය අනාවරණය කරන්න. ඒ වගේම බොහෝ අවස්ථාවල දී මහ බැංකුවේ නිලධාරීන්ට පාර්ලිමේන්තුවට ගොස් ආර්ථික කටයුතු පිළිබඳ ව පැහැදිලි කරන්න සිදු වෙනවා. ඒ අනුව නව මහ බැංකු පනත මගින් මහජනතාවටත් පාර්ලිමේන්තුවටත් ඇති වගවීම තහවුරු කරලා තිබෙනවා. මහ බැංකුවේ වගවීම වැඩි කරන විධිවිධානත් පනවමින් තමයි එහි ස්වාධීනත්වය තහවුරු කරලා තිබෙන්නේ.

ජානක මහත්මයා, එතුමිය සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව ලෙස අප මේ වනවිට නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ රාමුවකට අනුකූලවයි ක්‍රියාත්මක වන්නේ. මේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් ලෙස හඳුන්වන්නේ කුමක් ද?

මිල ස්ථායීතාව කියන සාර්ව ආර්ථික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින ප්‍රතිපත්තිය තමයි

මුදල් ප්‍රතිපත්තිය. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන රාමුව තමයි නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව කියන්නේ. ශ්‍රී ලංකාව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් ක්‍රියාත්මක කරන රටක් බව ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහිම දක්වා තිබෙනවා. ඒ වගේම තමයි නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයත් සමග නම්‍යශීලී විනිමය අනුපාතිකය කියන සංකල්පයත් බැඳී පවතිනවා. මෙහි දී දැඩි උද්ධමන ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යන ක්‍රම දෙක පැහැදිලි ව හඳුනා ගැනීම ඉතාම වැදගත්.

උද්ධමන ඉලක්කය ඇතැම් විට මහ බැංකුව විසින්ම නිර්මාණය කර ගන්නා ඉලක්කයක් වෙන්නත් පුළුවන් එසේත් නැත්නම් මහ බැංකුවත් රජයත් එකතු වෙලා නිර්මාණය කර ගන්නා ඉලක්කයක් වෙන්නත් පුළුවන් එසේත් නැත්නම් රජය ලබා දෙන ඉලක්කයක් වෙන්නත් පුළුවන්. ලංකාවේ තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවත් රජයක් එකතු වෙලා තීරණය කළ 5%ක උද්ධමන ඉලක්කයක්. උදාහරණ ලෙස දැඩි උද්ධමන ඉලක්ක පවතින රටවල් වශයෙන් එංගලන්තය, අමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව වගේ රටවල් හඳුනා ගන්න පුළුවන්. එම රටවල උද්ධමන ඉලක්කය 2%යි. එහිදී අදහස් කරන්නේ යම්කිසි අවස්ථාවක ආර්ථිකයේ උද්ධමනය 2%ට වඩා ඉහළ යන තත්ත්වයක් හෝ පහළ යන තත්ත්වයක් උද්ගත වුවහොත් අදාළ මහ බැංකුව ඉතා ඉක්මනින් නැවතත් උද්ධමනය 2% ඉලක්කගත මට්ටමක ගෙන ඒමට සිය ප්‍රතිපත්ති වෙනස් කරනවා. ඒක තමයි දැඩි උද්ධමන ඉලක්කකරණය කියලා කියන්නේ.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයේ දී වෙනස් වන්නේ, අපගේ ඉලක්කය 5%යි, සැබෑ උද්ධමනය මෙම ඉලක්කයෙන් වෙනස් වෙන්න පුළුවන්. එහිදී පවත්නා ප්‍රතිපත්ති යටතේම උද්ධමනය නැවතත් ඉලක්කගත මට්ටමට එන්න කොපමණ කාලයක් ගත වේවිද යන කාරණය පිළිබඳ ව මහ බැංකුව තමන්ගේ අවධානය යොමු කරනවා. යම් අවස්ථාවක උද්ධමනය 5% ඉලක්කගත මට්ටම දක්වා පැමිණීමට ප්‍රතිපත්ති වෙනස් කළ යුතු නම් මහ බැංකුව ප්‍රතිපත්ති වෙනස් කිරීමට කටයුතු කරනවා. ඒ වගේම අනාගත උද්ධමනය පවතින ප්‍රතිපත්ති රාමුව තුළම, සන්නිවේදනය තුළින් හෝ වෙනත් ක්‍රමවේද තුළින් උද්ධමනය ජනතාව වෙත නිවැරදිව සන්නිවේදනය කරලා නැවත ඉලක්කගත මට්ටම ගෙන එන්න පුළුවන් නම් මහ බැංකුවට සිය ප්‍රතිපත්ති උපකරණ භාවිත කරන්න අවශ්‍යතාවක් නැහැ. වෙනත් ආකාරයකට පැවසුවහොත් යම් අවස්ථාවක දී උද්ධමනය, උද්ධමන ඉලක්කයෙන් වැඩි හෝ අඩු වනවා නම් උද්ධමනය ඉලක්කගත මට්ටම පැමිණීමට කොපමණ කාලයක් ගත වනවා ද? කෙටි කාලීනව නැවතත් උද්ධමනය ඉලක්කයට ළඟා වනවා ද? වගේම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී උද්ධමනය පමණක් නොවෙයි මූර්ත ආර්ථිකයේ කටයුතු, විනිමය අනුපාතිකයේ හැසිරීම වැනි අනෙකුත් සාර්ව ආර්ථික විචල්‍යයන් වෙත අපගේ ප්‍රතිපත්තියෙන් වන බලපෑම් වැනි කරුණු අධ්‍යයනය කරලා තමයි ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස් කිරීමකට ලක් කරන්නේ. දැඩි උද්ධමන ඉලක්කකරණයක දී උද්ධමනය ඉලක්කගත මට්ටමෙන් වෙනස් වන විට මුදල් ප්‍රතිපත්ති හරහා ඍජුවම මැදිහත් වනවා. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයේ දී සාර්ව ආර්ථිකයේ අනෙකුත් සාධක පිළිබඳවත් අවධානය යොමු කරලා තමයි උද්ධමනය ඉලක්කගත මට්ටමට ළඟාකර ගැනීමට මහ බැංකුව කටයුතු කරන්නේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂතුමනි, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන සාධක මොනවා ද?

රටකට මුදල් ප්‍රතිපත්ති රාමුව, උද්ධමන ඉලක්කකරණ රාමුව නාමිකව පමණක් පැවතීම ප්‍රමාණවත් නැහැ. එහිදී සාක්ෂාත් කර ගත යුතු ක්‍රියාදාම කිහිපයක් පවතිනවා. පළමු කාරණාව තමයි ආචාර්ය යශෝධා මහත්මිය පැවසූ ආකාරයට මහ බැංකුව ස්වාධීන විය යුතුයි. එහිදී අදහස් කරන්නේ, මහ බැංකුවට තමන්ගේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ඕනෑම උපකරණයක් නිසි පරිදි ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නිදහසක් පැවතිය යුතු බවයි. එය තාක්ෂණික වශයෙන් මෙහෙයුම් ස්වාධීනත්වය ලෙස හඳුන්වනවා. එයින් අදහස් කරන්නේ පොලී අනුපාතික වෙනස් කිරීමකට හෝ ඕනෑම මුදල් ප්‍රතිපත්ති උපකරණයක් භාවිත කරන්න රජයෙන් හෝ තෙවන පාර්ශ්වයකින් කිසිදු බලපෑමක් නැති තත්ත්වයක්. නම්‍යශීලී ප්‍රතිපත්ති රාමුවක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සාධකයක් තමයි මේ ස්වාධීනත්වය.

අනෙක් කරුණ රාජ්‍ය මූල්‍ය අංශයෙන් ගත් විට, මුදල් ප්‍රතිපත්තියට සුදුසු, උද්ධමනය ඉලක්කය ළඟා කර ගැනීමට සුදුසු රාජ්‍ය මූල්‍ය තත්ත්වයක් පැවතිය යුතුයි. නිදසුන් ලෙස වර්තමාන තත්ත්වය ගත් විට, වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ ආදායම ඉලක්ක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩපිළිවෙළක්. වර්තමානයේ පවතින තත්ත්වය අනුව උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීමට නම් රාජ්‍ය ආදායම

වැඩි කර ගැනීමේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ඒ අයුරින්ම සිදු විය යුතුයි.

ඒ සමගම මහ බැංකුව තුළ තවත් සාධකයක් නිර්මාණය විය යුතුයි. අපි විශ්වසනීය විය යුතුයි. මහජනතාවගේ පිළිගැනීමට ලක්වන ආයතනයක් බවට මහ බැංකුව පත්විය යුතුයි. ඒ පිළිගැනීම හිමිවෙන්න නම් මහ බැංකුව මනා විනිවිදභාවයකින් යුතු ව වගවීමෙන් වගේම මහ බැංකුව සිදු කරන්නේ කුමක් ද සිදු කරන්නේ කෙලෙස ද කියන කාරණා ඉතා හොඳින් සන්නිවේදනය කරමින් කටයුතු කළ යුතුයි. මේ කාරණා සමග තමයි නම්‍යශීලී උද්ධමන ඉලක්කරණය කියන එක සාර්ථක කර ගත හැකි වන්නේ.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා ඉදිරි උද්ධමනය නිවැරදිව පුරෝකථනය කරන්න මහ බැංකුවට හැකි විය යුතුයි. ඒ සඳහා අවශ්‍ය මානව සම්පත වගේම තාක්ෂණික දැනුම මහ බැංකුව සතු විය යුතුයි. උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට නම් ආර්ථිකයේ සිදුවිය හැකි වෙනස්කම් පිළිබඳ ව ඉතා හොඳින් පුරෝකථනය කළ හැකි විය යුතුයි. සෑම මාසයකම සෑම අවස්ථාවකම 5% උද්ධමනය පවත්වා ගැනීමට හැකි විය යුතු බව එයින් අදහස් වන්නේ නැහැ.

විනිමය අනුපාතිකය නම්‍යශීලී විය යුතු බව මහ බැංකු පනතෙහිම සඳහන් වනවා. විනිමය අනුපාතිකය බලහත්කාරයෙන් පාලනය කිරීමෙන් නම්‍යශීලී උද්ධමක ඉලක්කකරණයක් පවත්වා ගත නොහැකියි.

උදාහරණ ලෙස මෑතකාලීන ව සිදු වූ මැදපෙරදිග යුදමය තත්ත්වයත් සමග අපගේ විදේශීය අංශයට දැඩි බලපෑමක් එල්ල වුණා. ඒ බලපෑම විනිමය අනුපාතිකය හරහා මැනවින් පෙන්නුම් කෙරුණා. ශ්‍රී ලංකා රුපියල මේ දක්වා මේ වසරේ 7%ක පමණ අගයකට අවප්‍රමාණය වුණා. එයින් එල්ලවන බලපෑම්වලට මුහුණ දෙන්න පුළුවන් ආර්ථික පරිසරයක් සාදා ගැනීමට විනිමය අනුපාතිකය ඔරොත්තු දිය යුතුයි.

2020 සැප්තැම්බර් සිට 2022 මාර්තු 7 දක්වා ඩොලරය රුපියල් 200ත් 203ත් අතර රඳවා ගෙන තිබුණා. ජාත්‍යන්තර වෙළඳපොළේ ගෝලීය ආර්ථිකයෙන්, ලංකාවේ දේශීය ආර්ථිකයෙන් විදේශ විනිමයට එල්ල වන පීඩනය එම විනිමය අනුපාතිකයෙන් පෙන්නුම් කෙරුණේ නැහැ. 2021 සැප්තැම්බර් මාසයේ 5.7% යක් වුණ උද්ධමනය 2022 සැප්තැම්බර් මාසය වනවිට 69.8%ක් දක්වා වැඩිවීමට මෙම විනිමය අනුපාතිකය බලහත්කාරයෙන් අඩු මට්ටමක රඳවා තබා ගැනීම හේතු වුණා. විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවයත් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සඳහා තිබිය යුතු ප්‍රධානතම සාධකයක්.

5%ක උද්ධමන ඉලක්කය කියන එකෙන් සෑම වේලාවකම 5% උද්ධමනයක් රඳවා ගන්නවා කියන කරුණ අදහස් කරන්නේ නැහැ. ආර්ථිකයේ පවතින යම් යම් තත්ත්වයන් මත එය වෙනස් වෙන්න පුළුවන්. විශේෂයෙන් සැපයුම් අංශයේ බාධා සමග උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම කෙරෙහි බාධා එල්ල විය හැකියි.

අප මීළඟට බලාපොරොත්තු වන්නේ සැපයුම මත පදනම් වූ උද්ධමනය පිළිබඳ ව ඔබට පැහැදිලි කිරීමට. නියෝජ්‍ය අධ්‍යක්ෂතුමනි මොකක්ද මේ සැපයුම මත පදනම් වූ උද්ධමන කියලා කියන්නේ? සැපයුම මත පදනම් වූ උද්ධමන තත්ත්වයන් ශ්‍රී ලංකාවට බලපාන්නේ කෙසේ ද?

ශ්‍රී ලංකාවේ 2026 මාර්තු මාසයේ උද්ධමනය පැවතුණේ 2%කට ආසන්නයේ. නමුත් මාස දෙකක් වැනි කාලයක් තුළ මැද පෙරදිග අර්බුදයත් සමග උද්ධමනය 6%ක් දක්වා ඉහළ ගියා. මේ කාල සීමාවේ උද්ධමනය වැඩි වීමට ප්‍රධානම හේතුව වුණේ සැපයුම් අංශයේ සාධක. රටක උද්ධමනයක් නිර්මාණය වෙන්න ප්‍රධාන වශයෙන් කාරණා තුනක් තිබෙනවා. එකක් තමයි ආර්ථිකයේ ඉල්ලුම වැඩි වීම තුළින් ඇති වන උද්ධමනය එනම් ආර්ථික ක්‍රියාකාරීත්වය තුළින් නිර්මාණය වූ භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම වැඩිවීම. දෙවන කාරණය තමයි සැපයුමෙන් නිර්මාණය වුණු උද්ධමනය. එයින් අදහස් වන්නේ, පිරිවැය වැඩිවීම හරහා සැපයුම් සීමා වීම. නමුත් ඉල්ලුම් පැවති ආකාරයෙන්ම පවතිනවා. එවිට සැපයුමේ පිරිවැය වැඩිවීම හේතුවෙන් මිල වැඩි වෙනවා. උදාහරණ ලෙස තෙල් මිල සලකමු. මැදපෙරදිග අර්බුදයට පෙර ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් බැරලයක මිල සටහන් වුණේ ඩොලර් 70කට ආසන්නයෙන්. මැද පෙරදිග අර්බුදය එහි උච්චතම අවස්ථාවට ළඟා වන විට බොරතෙල් බැරලයක මිලඩොලර් 120ක් දක්වා ඉහළ ගියා. එය දේශීය මිල ගණන් ඉහළ යෑමට හේතු වී තිබෙනවා. එය සම්පූර්ණයෙන්ම සැපුයම් අංශයෙන් සාධක හේතුවෙන් එල්ල වුණු බලපෑමක්.

තවත් ආකාරයක් සලකා බැලුවොත්, දේශගුණික තත්ත්වය වෙනස් වෙලා අපේ අස්වැන්න අඩු වෙනවා. එහිදීත් බලපාන්නේ සැපයුම් සාධකයක්. සාමාන්‍ය පරිදි ඉල්ලුම් පවතිනවා. සැපයුම සඳහා වන පිරිවැය

ඉහළයි. අපි බලාපොරොත්තු වුණු ආකාරයට සැපයුම නිෂ්පාදනය වෙලා නැහැ. භාණ්ඩ හා සේවාවල මිල වැඩි වෙනවා. මෙහිදී සිදු වන්නේ පිරිවැය වැඩි වීම භාණ්ඩ හා සේවාවල මිල වැඩිවීම හරහා උද්ධමනය ඉහළ යෑම තමයි සැපයුම් අංශය මත පදනම් වූ උද්ධමනය යන්නෙන් අදහස් කරන්නේ. අදහස් කරන්නේ. තුන්වන කාරණය තමයි, අහිතකර උද්ධමන අපේක්ෂාවන් එනම් පාරිභෝගිකයින් සහ ව්‍යාපාර අනාගත මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන විට, එය ස්වයංසාර්ථක අනාවැකියක් බවට පත්වේ. එනම් අනාගතයේ මිල ගණන් ඉහළ යනු ඇතැයි මිනිසුන් විශ්වාස කරන නිසා, ඔවුන් තම වියදම් සහ මිලකරණ පුරුදු වහාම වෙනස් කරයි, එතුලින් නොදැනුවත්වම භාණ්ඩ හා සේවාවල සැබෑ පිරිවැය ඉහළ නංවයි. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ මහ බැංකුවේ භූමිකාව, මිල ස්ථායීතාව සහ උද්ධමනය වැනි සංකල්ප ක්‍රියාත්මක වන ආකාරය සහ විශේෂයෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ රාමුව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව ඔබට යම් අවබෝධයක් ලැබෙන්නට ඇති.

ඔබ අප සියලුම දෙනා දන්නා කරුණක් තමයි 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු ව ශ්‍රී ලංකාව නැවතත් ආර්ථික ස්ථාවරයක් අත්කර ගත් බව. මේ ස්ථාවරත්වය අත්කර ගත්තේ කොහොම ද? විශේෂයෙන් මෙලෙස ස්ථාවරත්වයක් ඇතිකර ගැනීම ශ්‍රී ලාංකිකයින්ට වැදගත් වන්නේ කොහොම ද? අපි කැමතියි මේ පිළිබඳ ව ආචාර්ය යශෝධා මහත්මියගෙන් දැනගන්න.

2022 වර්ෂයේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවත් රජයත් පියවර රැසක් අනුගමනය කළා. රජය පැත්තෙන් ගත්තොත් රජය විසින් ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාත්මක කළා. විශේෂයෙන් ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග විස්තීර්ණ ණය පහසුකමක් යටතේ ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කළා. ඒ හරහා රජයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කිරීමට, යහපාලනය වැඩි දියුණු කිරීමට කටයුතු කළා. විශේෂයෙන් ම, ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් ක්‍රියාත්මක වුණා. ඒ හරහා රජයට, රජයේ ආදායම ඉහළ නංවා ගැනීමට හැකි වුණා. ඊට අමතර ව, රජයේ ණය කළඹ ප්‍රතිව්‍යුහගතකරණය හරහා ණය තිරසරභාවය ඇති කර ගැනීමට පියවර ගැනුණා.

මහ බැංකුව පැත්තෙන් ගත්තොත් අපි දන්නවා 2022 වසරේ දී උද්ධමනය විශාල වශයෙන් ඉහළ ගියා. ඒ අවස්ථාවේ දී, මහ බැංකුව පොලී අනුපාතික ඉහළ නැංවීම මගින් ඉතා කෙටි කාලයක් ඇතුළත උද්ධමනය ඉලක්කගත මට්ටම ආසන්නයට ගෙන ඒමට හැකියාව ලැබුණා. ඊට අමතර ව රුපියල අවප්‍රමාණය විමේ ඉහළ පීඩනයක් එම කාලවකවානුවේ දී දක්නට ලැබුණා. ඒ තත්ත්වය වළක්වා ගැනීමටත් පියවර ගත්තා. විශේෂයෙන්, ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය, ජංගම ගිණුම් ආශ්‍රිත ව යම් යම් සීමා පැනවීම හරහා රුපියල අවප්‍රමාණය වීමේ පීඩනය අවම කර ගැනීමට හැකි වුණා. 2023 වසරේ සිට අපි නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා. ඊට අමතරව මහ බැංකුව විශේෂයෙන් ම විදේශ සංචිත ගොඩනගා ගැනීමටත් කටයුතු කළා. ඒ අනුව රජයත් මහ බැංකුවත් ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ හරහා ඉතාමත් ඉක්මනින් ආර්ථික අර්බුදයෙන් මිදිලා, ඉතාමත් කෙටි කාලයකින් ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීමට හැකියාව ලැබුණා. සාර්ව ආර්ථික ස්ථායීතාව ළඟාකර ගැනීමට හැකියාව ලැබුණා.

අර්බුදයෙන් පසු ව උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගෙන යෑමට, සංචිත ගොඩ නගා ගැනීමට අපිට හැකි වී තිබෙනවා. මෙලෙස සාර්ව ආර්ථික ස්ථායීතාවක් ළඟාකර ගැනීමෙන් ආර්ථිකයේ සිටින සෑම පාර්ශ්වකරුවෙකුට ම ඉන් ප්‍රතිලාභ හිමි වනවා. විශේෂයෙන් ම සාර්ව ආර්ථික ස්ථායීතාවක් තිබෙනවා නම් ආර්ථිකයේ ඉදිරි කටයුතු පිළිබඳ ව පහසුවෙන් පුරෝකතනය කරන්න පුළුවන්. එවිට තමන්ගේ පරිභෝජනය, ආයෝජන සම්බන්ධයෙන් තීරණ ගැනීම ඉතා පහසු වනවා. ඒ වගේ ම ආයෝජකයන්ගේ පැත්තෙන් ගත්තොත්, සාර්ව ආර්ථික ස්ථායීතාවක් පවතින ආර්ථිකයක ආයෝජනය කරන්න ආයෝජකයන් කැමතියි. ආයෝජකයන්ටත් ආර්ථිකය පිළිබඳ විශ්වාසයක් ඇති වෙනවා. සාමාන්‍ය තත්ත්වය යටතේ සාර්ව ආර්ථික ස්ථායීතාව ආර්ථිකයේ සිටින සෑම පාර්ශ්වකරුවෙකුට ම ප්‍රතිලාභ ලබා දෙනවා. ඊට අමතර ව අඛණ්ඩ ව සාර්ව ආර්ථික ස්ථායීතාවක් පවත්වා ගෙන තිබීම ආර්ථිකය කම්පනවලට මුහුණ දෙන අවස්ථාවල දී ඉතාම වැදගත්.

ශ්‍රී ලංකාව වගේ රටක ආර්ථිකයක් ගත්තොත්, නිරන්තරයෙන් දේශීය මෙන්ම විදේශීය වශයෙන් ඇතිවන කම්පනවලට මුහුණ දීමට සිදු වනවා. ස්වාභාවික ආපදාවලට මුහුණ දීමට සිදු වනවා. විදේශීය අංශයෙන් ගත්තොත්, දේශපාලනික අර්බුද, ඛනිජ තෙල් මිල ඉහළ යෑම වගේ කරුණු නිසා අපට නිතර ම ආර්ථික කම්පනවලට මුහුණ දීමට සිදු වනවා.

මෙවැනි ආර්ථික කම්පනවලට මුහුණ දෙන ආර්ථිකයක ආරම්භයේ සිටම සාර්ව ආර්ථික ස්ථායීතාවක් පවත්වා ගත්තොත් අපිට පුළුවන් ශක්තිමත් පදනමක් මත පිහිටා එම ආර්ථික කම්පනවලට මුහුණ දෙන්න. ආර්ථික කම්පනයෙන් ඇතිවන බලපෑම් යම් ප්‍රමාණයකින් හෝ සීමා කර ගැනීමට අපිට හැකියාව ලැබෙනවා. උදාහරණයක් විදිහට ආර්ථික කම්පනයක දී උද්ධමනය වැඩි වීමේ අවස්ථාවක් පවතිනවා. උද්ධමනය මුල සිට ම අඩු ස්ථාවර මට්ටමට පවත්වාගෙන තිබෙනවා නම් බාහිර කම්පන හේතුවෙන් උද්ධමනය විශාල වශයෙන් ඉහළ යන්නේ නැහැ. අපිට පුළුවන් එය පාලනය කරගන්න. ඒ නිසා තමයි සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වාගෙන යෑම ඉතා වැදගත් වන්නේ.

ඒ වගේම ආර්ථික කම්පනවලට මුහුණ දෙන විට බොහෝ විට ඉන් වැඩි බලපෑමට ලක්වන්නේ අඩු ආදායම්ලාභීන්. ආර්ථික කම්පනවලට මුහුණ දෙන අවස්ථාවල දී සාර්ව ආර්ථික ස්ථායීතාවක් පවත්වාගෙන ගොස් කම්පනයෙන් ඇතිවල බලපෑම අවම කර ගන්න පුළුවන් නම්, අඩු ආදායම්ලාභී ඒ වගේම අවදානමට ලක්වන පිරිසට එල්ලවන බලපෑමත් අඩුකර ගන්න පුළුවන්. ඒ අනුව සාර්ව සහභාගීත්වයෙන් යුතු සෑම දෙනාට ම ප්‍රතිලාභ ලැබෙන සංවර්ධනයක් ඇතිකර ගැනීමට අඛණ්ඩ ව සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වාගෙන යෑම ඉතාමත් වැදගත් වෙනවා.

ශ්‍රී ලංකාව වගේ රටක ආර්ථිකයක් ගත්තොත්, නිරන්තරයෙන් දේශීය මෙන්ම විදේශීය වශයෙන් ඇතිවන කම්පනවලට මුහුණ දීමට සිදු වනවා. ස්වාභාවික ආපදාවලට මුහුණ දීමට සිදු වනවා. විදේශීය අංශයෙන් ගත්තොත්, දේශපාලනික අර්බුද, ඛනිජ තෙල් මිල ඉහළ යෑම වගේ කරුණු නිසා අපට නිතර ම ආර්ථික කම්පනවලට මුහුණ දීමට සිදු වනවා. මෙවැනි ආර්ථික කම්පනවලට මුහුණ දෙන ආර්ථිකයක ආරම්භයේ සිටම සාර්ව ආර්ථික ස්ථායීතාවක් පවත්වා ගත්තොත් අපිට පුළුවන් ශක්තිමත් පදනමක් මත පිහිටා එම ආර්ථික කම්පනවලට මුහුණ දෙන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂතුමියනි, අනාගතයේ දී ඇති විය හැකි මෙවැනි ආර්ථික කම්පනවලට හොඳින් ඔරොත්තු දීම සඳහා ශ්‍රී ලංකාවට තම ප්‍රතිපත්ති ස්වාරක්ෂක ශක්තිමත් කරගත හැක්කේ මොන ආකාරයට ද?

නිරන්තරයෙන් දේශීය සහ විදේශීය කම්පනවලට මුහුණ දෙන ආර්ථිකවලට ප්‍රතිපත්ති ස්වාරක්ෂක (Policy buffers) ඉතාමත් වැදගත්. ආර්ථිකයක් හොඳින් පවතින අවස්ථාවල දී ප්‍රතිපත්ති ස්වාරක්ෂක ගොඩනගා ගන්න අපි සැමවිටම උත්සාහ කරන්න ඕනේ. එවිට ආර්ථික කම්පනයක් ඇතිවන අවස්ථාවල දී ඊට හොඳින් මුහුණ දීමට අපිට ශක්තිය තිබෙනවා. අපි අහලා තිබෙනවා කුඹි වැහි කාලයේ දී භාවිත කරන්න පායන කාලයේ දී කෑම එකතු කරනවා කියලා. ඒ ආකාරයට ආර්ථිකය කම්පන නොමැති හොඳ කාලවල දී හැකිතරම් ප්‍රතිපත්ති ස්වාරක්ෂක ගොඩනගා ගන්න ඕනේ.

ප්‍රතිපත්ති ස්වාරක්ෂක කියන්නේ මොනවා ද කියලා බැලුවොත් පළමු ප්‍රතිපත්ති ස්වාරක්ෂකය විදිහට රාජ්‍ය මූල්‍ය අවකාශය පවත්වාගෙන යෑම හඳුනාග න්න පුළුවන්. ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වන විට මහජනතාව ඒ වගේම ව්‍යාපාර සහනාධාර, බදු සහන ලබා ගැනීමට බොහෝ විට උත්සාහ ගන්නවා. නමුත් ඇත්තට ම ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වන, කම්පන නොමැති කාලවල දී තමන්ගේ රාජ්‍ය මූල්‍ය අවකාශය වැඩිකර ගැනීමට රජයක් උත්සාහ කරන්න ඕනේ. තමන්ගේ බදු පදනම පුළුල් කරගෙන බදු කළමනාකරණය ඉහළ නැංවීම හරහා රජයේ ආදායම වැඩිකර ගැනීමට උත්සාහ කළ යුතුයි. ඒ හරහා අයවැය හිඟය අඩු කර ගැනීමට, රජයේ ණය ආපසු ගෙවීම හරහා ණය මට්ටම අඩුකර ගන්න උත්සාහ කළ යුතුයි. එවිට ආර්ථික කම්පනයක් ඇති වූ අවස්ථාවක් දී එම කම්පනය හරහා බලපෑමට ලක්වන ජනතාවට, ව්‍යාපාරවලට සහන ලබාදෙන්න රජයට පුළුවන්. ණය මට්ටම පහළ අගයක පවතින විට කම්පන අවස්ථාවක දී ණය තිරසරභාවය පිළිබඳ ප්‍රශ්නයක් ඇතිකරගන්නේ නැතිව අලුතෙන් ණය ලබාගෙන හෝ සහනාධාර ලබා දෙන්න පුළුවන්. ඒ නිසා තමයි රාජ්‍ය මූල්‍ය අවකාශය පවත්වා ගැනීම ප්‍රතිපත්ති ස්වාරක්ෂකයක් විදිහට හඳුනා ගැනෙන්නේ.

දෙවන ප්‍රතිපත්ති ස්වාරක්ෂකය තමයි විදේශ සංචිත ගොඩනගා ගැනීම. ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වනවිට රටට විදේශ විනිමය ගලා එනවා. ඒ වගේ ම විදේශ සේවා නියුක්තකයින්ගෙන් ලැබෙන ප්‍රේෂණවලින්, සංචාරක ඉපැයීම්වලින් විදේශ විනිමය ලැබෙනවා. අර්බුද කාලවල දී සිදුකළ යුත්තේ විදේශ සංචිත ගොඩනැගීම. ආර්ථික කම්පන ඇතිවන අවස්ථාවල දී බොහෝ විට රුපියල අවප්‍රමාණය වීමේ පීඩනයක් ඇති වෙන්න පුළුවන්. ආර්ථික හොඳින් ක්‍රියාත්මක වන අවස්ථාවල දී විදේශ සංචිත ගොඩ

නගා ගැනීමෙන් ආර්ථික කම්පන අවස්ථාවල දී රුපියල අවප්‍රමාණය වීමේ පීඩනය, විදේශ විනිමය විචලනය වීම යම් මට්ටමකට අඩුකර ගත හැකියි. ආර්ථික කම්පනයක් ඇති වුණොත් ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා මුලින් ම යොදාගන්නේ විදේශ සංචිත. ඒ වගේ ම විදේශ සංචිත ප්‍රමාණය හොඳ මට්ටමක තිබෙනවා නම් ආයෝජකයන් පවා ආර්ථිකය පිළිබඳ ව විශ්වාසය තබනවා. ආර්ථික කම්පනයක දී වුවත් එම විශ්වාසය ඒ ආකාරයෙන් ම පවත්වා ගන්න පුළුවන්. විදේශ සංචිත ගොඩනංවා ගැනීම ස්වාරක්ෂකයක් ලෙස සැලකෙන්නේ ඒ හේතුවෙන්.

ඊට අමතර ව මූල්‍ය පද්ධතිය ස්ථායීව පවත්වා ගෙන යෑමත් එක්තරා ආකාරය ස්වාරක්ෂකයක්. ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වන කාලවල දී මහ බැංකුව වැනි, මූල්‍ය ආයතන නියාමනය කරන ආයතන ඒ මූල්‍ය ආයතනවල තිබෙන ප්‍රාග්ධන අවශ්‍යතා වැඩිකර ගැනීම, ද්‍රවශීලතා අවශ්‍යතා ඉහළ නංවා ගැනීම හරහා ඒ මූල්‍ය ආයතනවල මූල්‍ය තත්ත්වය යහපත් කිරීමට උත්සාහ කළ යුතුයි. මූල්‍ය ආයතනවල මූල්‍ය ස්ථාවරයක් තිබෙනවා නම් ආර්ථික කම්පනවල දී යම් යම් අලාභ තත්ත්ව ඇති වූ විට එම අලාභ අවශෝෂණය කර ගැනීමට, කඩා වැටීමකින් තොර ව ආයතන පවත්වා ගෙන යෑමට එම ආයතනවලට හැකියාව ලැබෙනවා.

සාමාන්‍යයෙන් ආර්ථික අර්බුද ඇතිවන බොහෝ රටවල් මූල්‍ය පද්ධතියේ කඩා වැටීමකටත් මුහුණ දුන්නා. නමුත් 2022 වසර ගත්තොත් ශ්‍රී ලංකාවට එවැනි තත්ත්වයකට මුහුණ දීමට සිදු වුණේ නැහැ. ආරම්භයේ සිට ම ශ්‍රී ලංකා මහ බැංකුව තමන්ගේ නියාමනය හොඳින් ඉටු කිරීම නිසා අපගේ මූල්‍ය පද්ධතිය ඉතා ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට හැකි වුණා. යම් යම් අවදානම් සහගත තත්ත්ව ඇති වුණත් එම අවදානම්වලට සාර්ථක ව මුහුණදීමට මූල්‍ය පද්ධතියට හැකියාව ලැබුණා. ඒ හරහා පීඩනයට පත් වූ ජනතාවට සහන ලබා දීමටත් අනෙකුත් ආයතනවලට සහය ලබා දීමටත් මූල්‍ය පද්ධතියට හැකියාව ලැබුණා. ඒ අනුව මූල්‍ය පද්ධතිය ස්ථාවර ව තිබීම එක් ස්වාරක්ෂකයක් විදිහට හඳුනා ගැනෙනවා.

ඒ වගේම මහජනතාව විශ්වාස කරන මුදල් ප්‍රතිපත්ති රාමුවක් ක්‍රියාත්මක කිරීමත් එක් ස්වාරක්ෂකයක්. මහ බැංකුව විසින් උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගන්නවා, අනිවාර්යයෙන් උද්ධමන ඉලක්කය මත උද්ධමනය පවත්වාගෙන යනවා කියලා මහජනතාව විශ්වාස කරනවා නම්, ආර්ථික කම්පනයක දී උද්ධමනය වැඩි වුණත් එය සිදු වන්නේ කෙටි කාලයකට කියන බව ජනතාව විශ්වාස කරනවා. ඒ අනුව අපිට උද්ධමන අපේක්ෂා කළමනාකරණය සිදු කරන්න පුළුවන්. එවිට කෙටි කාලයක දී උද්ධමනකාරී තත්ත්වයක් ඇති වුණා වුවත් උද්ධමනය පහසුවෙන් නැවතත් ඉලක්කගත මට්ටමට ගෙන ඒමට පුළුවන්.

ප්‍රතිපත්ති ස්වාරක්ෂක ගොඩනගා ගත යුත්තේ ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වන කාලවල දී. එවිට දේශීය හෝ විදේශීය කම්පනවලට ආර්ථිකය මුහුණ දෙන විට ඊට වඩාත් සාර්ථක ව මුහුණ දීමේ හැකියාව හිමි වනවා.

අපි තවදුරටත් ඔබතුමියගෙන් දැනගන්න කැමතියි, පෙර සාකච්ඡා කළ බාහිර ආර්ථික කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නැංවීමේ දී ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල වැදගත්කම නැත්නම් එහි අවශ්‍යතාව මොන වගේ ද? කියන කාරණාව

දේශිය හෝ විදේශීය කම්පන ඇති වන අවස්ථාවල දී සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගෙන යෑමත් ඒ වගේම ප්‍රතිපත්ති ස්වාරක්ෂක පවත්වාගෙන යෑමත් හරහා එම කම්පනවලින් එල්ල වන බලපෑම් අඩුකර ගන්න පුළුවන්. නමුත් අපිට ඒ හරහා ආර්ථික කම්පන ඇති වීමේ අවදානම අඩුකර ගන්න අසීරුයි. ආර්ථික කම්පන ඇති වීමේ අවදානම අඩුකර ගන්න නම් අපි ඉන් ඔබ්බට ගොස් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුයි. උදාහරණ වශයෙන් විදේශ අංශය පිළිබඳ ව අවධානය යොමු කළොත්, අපිට ඉහළ අපනයන ආදායමක් ලැබෙන්නේ භාණ්ඩ කිහිපයක් හරහා. ඇඟලුම්, තේ, පොල්, රබර් වැනි අපනයන භාණ්ඩ කිහිපයක් හරහා තමයි අපනයන ආදායම ලැබෙන්නේ. ඒ වගේම අපනයන ගමනාන්ත ගත්තොත් අපේ රටේ තියෙන්නේ බොහොම සීමිත අපනයන ගමනාන්ත. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය වගේ අපනයන ගමනාන්ත සීමා සහිතයි. අපනයන ගමනාන්ත සීමා සහිත වීම බාහිර කම්පන ඇති වීමේ අවදානම වැඩි කරනවා. උදාහරණ වශයෙන්, පසුගිය වසරේ දී අමෙරිකා එක්සත් ජනපදය තමන්ගේ තීරු බදු සංශෝධනය කරන අවස්ථාවේ දී ඉන් අපගේ අපනයනවලට විශාල බලපෑමක් එල්ල වීමේ අවස්ථාව පැවතියා. ඊට හේතුව තමයි අපේ අපනයනවලින් 20%ක් 25%ක් පමණ සිදු වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයට වීම. ඒ රටවල තීරු බදු වෙනස් වුණොත් අපේ අපනයන අංශයට විශාල බලපෑමක් ඇති වනවා.

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පිළිබඳ ව සලකා බැලුවොත්, ඉන් 40%ක් 45%ක් පමණ

සිටින්නේ මැද පෙරදිග කලාපයේ. සාමාන්‍යයෙන් මැද පෙරදිග රටවල්වල නිරන්තරයෙන් භූ දේශපාලනික කම්පන ඇති වනවා. ඒ වගේ රටවල්වලින් එල්ල වන බලපෑම් ලංකාවට ලැබෙන ප්‍රේෂණවලට බලපෑමක් ඇති කරනවා. මේ ආකාරයට බාහිර කම්පනවලින් ලංකාවට ඇති වන අවදානම අඩුකර ගැනීමට නම් අපේ අපනයන, අපනයන ගමනාන්ත ඒ වගේම විදේශ සේවා නියුක්තිකයින් සේවය කරන රටවල් විවිධාංගීකරණය කිරීම ඉතා වැදගත්. ඒ හරහා අපිට බාහිර කම්පන ඇති වීමේ අවදානම අඩුකර ගන්න පුළුවන්.

ඊට අමතර ව, බලශක්ති අංශය පිළිබඳ ව සලකා බැලුවොත් බලශක්ති අංශය විශේෂයෙන් රඳා පවතින්නේ ආනයන කරන ලද ඛනිජ තෙල්, ගල් අඟුරු මත. ගෝලීය ආර්ථිකයේ ඛනිජ තෙල් මිල ඉහළ යෑම, ගල් අඟුරු මිල ඉහළ යෑම්නිසා අපට නිරන්තරයෙන් බාහිර කම්පනවලට මුහුණ දීමට සිදු වනවා. එවැනි තත්ත්ව ඇති වීම වළක්වා ගැනීමට නම් බලශක්ති අංශයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුයි. විශේෂයෙන් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුයි. පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කිරීමේ දී යම් යම් ගැටලු ඇති වෙන්න පුළුවන්. නිදසුන් ලෙස බැටර සංචිත නොමැති වීම වැනි ගැටලු. එවැනි දේවල්වලට ආයෝජනය ඉහළ නැංවීම හරහා අපිට පුනර්ජනනීය බලශක්ති අංශයේ වර්ධනයක් ඇතිකර ගන්න පුළුවන්. එමගින් බලශක්ති අංශයට බාහිර කම්පන ඇති විමේ අවදානම අඩුකර ගන්න පුළුවන්.

බලශක්ති අංශය විශේෂයෙන් රදා පවතින්නේ ආනයන කරන ලද ඛනිජ තෙල්, ගල් අඟුරු මත. ගෝලීය ආර්ථිකයේ ඛනිජ තෙල් මිල ඉහළ යෑම, ගල් අඟුරු මිල ඉහළ යෑම්නිසා අපට නිරන්තරයෙන් බාහිර කම්පනවලට මුහුණ දීමට සිදු වනවා. එවැනි තත්ත්ව ඇති වීම වළක්වා ගැනීමට නම් බලශක්ති අංශයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුයි. විශේෂයෙන් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුයි.

ඒ වගේම ශ්‍රී ලංකාව නිරන්තරයෙන් දේශගුණික විපර්යාසවලට මුහුණ දෙනවා. විශේෂයෙන් ම කෘෂිකර්මාන්තය ඉන් විශාල බලපෑමකට ලක් වනවා. දේශගුණික විපර්යාසවලින් ඇති වන බලපෑම අඩුකර ගන්න නම් ඒ දේශගුණික විපර්යාසවලට අනුගත වන සුහුරු කෘෂිකර්මාන්තයක් (Smart Agriculture) ප්‍රවර්ධනය සඳහා යම් යම් ප්‍රතිසංස්කරණ කළ හැකියි.

මේ අපිට සිදු කළ හැකි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කිහිපයක් පමණයි. එම ප්‍රතිසංස්කරණ හරහා දේශීය හා විදේශීය වශයෙන් ඇතිවන කම්පනවලින් එල්ල වන අවදානම අඩුකර ගන්න පුළුවන්.

ජානක මහත්මයා අවසාන වශයෙන් වැඩසටහන නරඹන සියලු දෙනා වෙනුවෙන් අපි කියමු ආර්ථිකය වැඩි දියුණු කිරීම සඳහා රටක් වශයෙන් ගත හැකි පියවර මොනවා ද?

ශ්‍රී ලංකා මහ බැංකුව විදිහට ගත්තොත් 1990 දශකයේ පමණ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණයේ අපි කොටසක් වෙන් කරනවා ප්‍රතිපත්ති සහ ගැටලු වෙනුවෙන්. එහි දී අපි ආර්ථිකයේ තිබෙන ගැටලු, ක්‍රියාත්මක විය යුතු නිවැරදි ප්‍රතිපත්ති මොනවා ද කියන එක කාලයක් පුරාවට අපි සාකච්ඡාවට ලක් කරනවා. ඉතිහාසයේ සාකච්ඡා කළ ඇතැම් දේවල් අපි තවමත් සාකච්ඡා කරනවා.

ලංකාවේ ප්‍රතිපත්ති පිළිබඳ ව සාකච්ඡා වෙලා තිබෙනවා නමුත් ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීමේ ගැටලුවක් තමයි ශ්‍රී ලංකාවේ තිබෙන්නේ. නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති කාලයක් පුරා අඛණ්ඩ ව පවත්වාගෙන ගියා නම් ශ්‍රී ලංකාව මීට වඩා දියුණු ආර්ථිකයකට හිමිකම් කීමේ හැකියාව පවතිනවා. අපි සංවර්ධන මාවතේ මීට වඩා ඉහළට ගොස් සිටීමේ අවස්ථාව තිබෙනවා. අපි ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න නම්, දේශපාලන මැදිහත් වීමකින් තොර ව අඛණ්ඩ ව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුයි. ඒ සඳහා අපි විදේශ ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම, අපනයන විවිධාංගීකරණය, අත්‍යවශයෙන් ම රට තුළ ක්‍රියාත්මක කළ යුතු, ක්‍රියාත්මක විය යුතු නෛතික ප්‍රතිසංස්කරණ වැනි දේවල් අනිවාර්යෙන් ම සිදුකළ යුතුයි. ඒ වගේම රාජ්‍ය මූල්‍ය උත්තේජන එසේත් නැත්නම් මුදල් ප්‍රතිපත්ති උත්තේජනවලින් නැගිටීමක් ලබාගන්න පුළුවන් කියලා සාමාන්‍ය මහජනතාව බොහෝ විට අපේක්ෂා කරනවා. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හෝ මුදල් ප්‍රතිපත්තිවලින් ලබා දෙන උත්තේජන තාවකාලිකයි. ඒවා සිදු කරන්නේ කෙටි කාලීන අරමුණු වෙනුවෙන්. ස්ථිරසාර ලෙස ආර්ථික ගමන් මග වෙනස් කරන, ඉතා ඉහළ ආර්ථික වෘද්ධියක් ළඟාකරන මාර්ගයක් නෙවෙයි. අපි ආර්ථික වර්ධනයක් ළඟාකර ගන්න නම්, නිවැරදි ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය යුතුයි. ඒ සඳහා

අවශ්‍ය නෛතික ප්‍රතිපත්ති අඛණ්ඩ ව කාලයක් පුරා ක්‍රියාත්මක වුණොත් අපිට ඉතා යහපත් ආර්ථික හෙට දවසක් ළඟාකර ගන්න පුළුවන්. එම ප්‍රතිපත්ති මහ පොළොවේ ක්‍රියාත්මක කිරීමයි කළ යුත්තේ.

ඔබ දැනුවත් වුණා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ඇති වුණ කම්පන මොනවා ද? ශ්‍රී ලංකාව ඒ සඳහා සාර්ථක ව මුහුණ දුන්නේ කොහොම ද? ඒ වගේම ආර්ථික කම්පනවලට මුහුණ දීමට අවශ්‍ය කරන ස්වාරක්ෂක ඒ වගේම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මොනවාද කියන කරුණු පිළිබඳ ව.

මේ තුළින් ඔබට ආර්ථික සංකල්ප පිළිබඳ ව වගේ ම ශ්‍රී ලංකා මහ බැංකුව විදිහට අපගේ කාර්යභාරය කුමන ආකාරයේ ද යන කරුණු පිළිබඳ ව ඔබට අවබෝධයක් ලැබෙන්නට ඇතැයි බලාපොරොත්තු වනවා.

සාකච්ඡා කළේ - සමන්තිකා යාපා,
සහකාර අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික කාර්යභාරය පිළිබඳ ව ඔබට යම් තොරතුරක් අවශ්‍යනම් මෙහි දැක්වෙන දුරකථන හෝ ඊමේල් ලිපින ඔස්සේ සම්බන්ධ වී අවශ්‍ය තොරතුරු ලබා ගන්න.

011-24477567
directorerd@cbsl.lk

මෙම සාකච්ඡාව නැරඹීමට පහත
QR කේතය Scan කරන්න.

YouTube

1 කොටස

මෙම සාකච්ඡාව නැරඹීමට පහත
QR කේතය Scan කරන්න.

YouTube

2 කොටස

නිවැරදි ආයෝජන තීරණ සාර්ථක අනාගතයක පදනමයි

දුමින්ද දිසානායක
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
ශ්‍රී ලංකා මහ බැංකුව
ප්‍රාදේශීය කාර්යාලය අනුරාධපුර.

1. ආයෝජනය යනු කුමක්ද?

පුද්ගලයාගේ භෞතික දියුණුව උදෙසා ඔහු හෝ ඇය සතු නැතිනම් උපයාගත් ධනය වැදගත් කාර්යයක් ඉටු කරයි. එහිලා ආයෝජනය කෙරෙහි පෙළඹීම තුළින් ධනය වර්ධනය කළ හැකි බව අප කවුරුත් දන්නා කරුණකි. පුද්ගල දියුණුව සාක්ෂාත් කර ගැනීමට නම් තමා සතු වත්කම් නිසි කළමනාකරණයකින් යුතුව හැසිරවීම වඩාත් යෝග්‍ය වේ. එය සරල ව කිවහොත් ආයෝජනය ලෙස හැඳින්විය හැකි ය. තමන් සතු වත්කම් ආයෝජනය කරනුයේ කුමන අරමුණකින් ද කෙසේ ද යන්න පිළිබඳව තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් නිවැරදි අවබෝධයක් ලබා තිබීම වඩාත් උචිත වේ. පුද්ගලයකුට තම ආදායම් නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් ඉතිරිකිරීම්වල සිට විවිධ ආයෝජනය අවස්ථා දක්වා යොමුවීමට නිසි මග පෙන්වීමක් අවශ්‍ය වේ. මෙම ලිපියේ අරමුණ වන්නේ ආයෝජනය සම්බන්ධ දැනුවත්භාවය වැඩි දියුණු කර ගැනීම හරහා ධනය වර්ධනය කර ගැනීමට අවස්ථාවන් නිර්මාණය කර ගැනීමත් ඒ තුළින් අනාගතයේ දී මූල්‍ය ආරක්ෂාව සහතික කිරීමත්ය.

2. ආයෝජන අවස්ථා

ආයෝජන අවස්ථා තෝරා ගැනීමේ දී ආයෝජකයකු වශයෙන් දැනගත යුතු ප්‍රධාන මූලධර්ම කිහිපයක් පවතී. ඒ අතර ආවස්ථික පිරිවැය මෙන්ම අවදානම සහ ප්‍රතිලාභ යන මූලධර්ම ඉතා වැදගත්වේ.

- ආවස්ථික පිරිවැය ආයෝජන තීරණයක් ගැනීමේ දී, ඔබ විසින් තෝරාගත් ආයෝජනය වෙනුවට අහිමි වූ ආදායම ඔබේ ආයෝජනයේ ආවස්ථික පිරිවැයයි. උදාහරණයක් ලෙස ඔබ වසර 5ක් සඳහා ඉතුරුම් තැන්පතුවක රුපියල් මිලියන 1ක් ආයෝජනය කර ඇතැයි සිතමු. එහෙත් එම මුදල් ඔබ කොටස් හෝ දේපළ ආයෝජනයක් වැනි ඉහළ ප්‍රතිලාභ සහිත විකල්ප අවස්ථාවක ආයෝජනය කළේ නම් ඔබට උපයා ගත හැකි ආදායම වැඩි අගයක් ගත හැකි අතර එය ඉතුරුම් ගිණුමේ පොළී ආදායම සමග සංසන්දනය කළ හැකි ය. ඒ අනුව ඔබට අහිමිවීමට ඉඩ තිබූ ආදායම ඔබේ ආවස්ථික පිරිවැයයි.

- අවදානම සහ ප්‍රතිලාභ අවදානම හා ප්‍රතිලාභය අතර අනුලෝම (ධනාත්මක) සම්බන්ධතාව ක් පවතී.

ඉහළ ප්‍රතිලාභයක් බලාපොරොත්තු වන්නේ නම් ඉහළ අවදානමක් බාර ගත යුතු ය. උදාහරණයක් ලෙස බැංකු තැන්පතුවක ආයෝජනයකින් ආයෝජන අවදානම අඩු වන අතර ප්‍රතිලාභය ද අඩු වේ. කොටස් වෙළෙඳපොළ ආයෝජනය අවදානම වැඩි අතර ප්‍රතිලාභය වැඩිවිය හැකි ය. එබැවින් ඔබේ අනාගත අරමුණු සහ ඔබට දරාගත හැකි අවදානමට ගැලපෙන ලෙස ආයෝජන තෝරා ගත යුතු ය.

ශ්‍රී ලංකාව තුළ පවතින ආයෝජන අවස්ථාවන් පහත පරිදි හඳුනා ගත හැකිය. එනම්

2.1 ස්ථාවර තැන්පතු

සාමාන්‍ය ඉතුරුම් තැන්පතු හා ස්ථාවර තැන්පතු වෙනස හඳුනා ගැනීම වැදගත් වේ. සාමාන්‍ය ඉතුරුම් ගිණුම් යනු ඕනෑම වේලාවක මුදල් තැන්පත් කිරීමට සහ ආපසු ගැනීමට හැකි, අඩු පොලියක් සහිත දෛනික අවශ්‍යතා සඳහා වන ගිණුම් වේ. ස්ථාවර තැන්පතු යනුවෙන් අදහස් වන්නේ බලපත්‍රලාභී බැංකුවක හෝ මූල්‍ය ආයතනයක නිශ්චිත කාල සීමාවකට කලින් තීරණය කළ පොලී අනුපාතිකයට මුදල් තැන්පත් කරන ආයෝජන ක්‍රමයකි.ස්ථාවර හෝ කාලීන තැන්පතු සඳහා ඉතුරුම් තැන්පතුවලට වඩා වැඩි පොලී අනුපාතිකයක් ගෙවනු ලැබේ. මෙම ස්ථාවර තැන්පතු පවත්වාගෙන යෑමේ දී වෙළෙඳපොළ පොලී අනුපාතිකයේ හැසිරීම මත තීරණ ගැනීමට ආයෝජකයා බුද්ධිමත් විය යුතු ය. වෙළෙඳපොළ පොලී අනුපාතිකය අඩු මට්ටමක පවතින විට කෙටි කාලීනවත් වැඩි මට්ටමක පවතින විට දිගු කාලීනවත් ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් සාර්ථක ආයෝජන ප්‍රතිලාභ අත්කර ගත හැක.

ස්ථාවර තැන්පතුවල ආයෝජනයේ දී වාර්ෂික සඵල පොලී අනුපාතය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

වාර්ෂික සඵල පොලී අනුපාතය (AER)= (1+ (r/n)^n)-1

n= වසරක් තුළ ගෙවන පොලී වාර ගණන

r= නාමික පොලී අනුපාතිකය

වාර්ෂික සඵල පොලී අනුපාතිකය ස්ථාවර තැන්පතුවකට ගෙවන පොලී අනුපාතිකය සමග සන්සන්දනය කළහොත් පහත උදාහරණය මගින් පැහැදිලි කර ගත හැකි ය. වාර්ෂික නාමික පොලී අනුපාතය 15% වන, වර්ෂයක කල්පිරීමක් සහිත ස්ථාවර තැන්පතුවකට මාසික ව පොලී මුදල ගෙවනු ලබයි නම් එහි වාර්ෂික සඵල පොලී අනුපාතය පහත පරිදි ගණනය කළ හැකි ය.

AER = (1+ (r/n)^n)-1

= [(1+0.15/12)12] -1

= 16.075%

මේ අනුව බැංකුවක් විසින් ආයෝජකයාට නාමික ව ලබා දෙන පොලි අනුපාතයට වඩා වාර්ෂික සඵල පොලී අනුපාතය ඉහළ වන අතර ස්ථාවර තැන්පතු සම්බන්ධ තීරණ ගැනීමේ දී මේ සම්බන්ධ දැනුවත්භාවය ලබා තිබීම වැදගත් ය. තවද කෙටිකාලීන ව ස්ථාවර තැන්පතුවක ආයෝජනයේ දී වාර්ෂික සඵල පොලී අනුපාතිකය නාමික පොලී අනුපාතිකයට වඩා වැඩිවන අතර දිගුකාලීන ව ස්ථාවර තැන්පතුවක ආයෝජනයේ දී වාර්ෂික සඵල පොලී අනුපාතිකය නාමික පොලී අනුපාතිකයට වඩා අඩු විය හැකි ය.

2.2 ආයෝජන සැලසුම්

මාසික ඉපයීම් යැපුම් මට්ටමින් ඔබ්බට ඉතිරි කිරීමක් දක්වා යොමු කිරීම පුද්ගල සාර්ථකත්වය සඳහා වඩාත් වැදගත් වේ. ආයෝජන සැලසුම් ප්‍රධාන වශයෙන් වැඩිහිටි මෙන්ම ළමා ආයෝජන වශයෙන් බලපත්‍රලාභී බැංකුවල ක්‍රියාත්මක වේ. උදාහරණයක් වශයෙන් යම්කිසි පුද්ගලයකු A නම් බැංකුවේ වැඩිහිටි ආයෝජන සැලසුම් ගිණුමක මාසිකව රු.10,000.00 ක මුදලක් 10% ක වාර්ෂික පොලියක් යටතේ වසර 6 ක් සඳහා අයෝජනය කරයි නම් එම පුද්ගලයාට වසර 6ක් අවසානයේ රු. ලක්ෂ 10ක් ලබා ගත හැක. තවද ළමා ගිණුම් ද සාමාන්‍ය ඉතිරිකිරීම් ලෙස නොව ළමා අයෝජන සැලසුම් ලෙස ආයෝජනය කිරීම තුළින් දරුවන්ගේ අනාගතය නිවැරදිව සැලසුම් කිරීමට දෙමව්පියන්ට අවස්ථාව උදා වේ.

2.3 රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

රජයේ සුරැකුම්පත් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ලෙස හඳුනාගත හැක. මෙම සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන් හරහා දේශීය අයෝජකයන්ට අයෝජනය කිරීමට අවස්ථාව පවතී.

2.3.1 භාණ්ඩාගාර බිල්පතක් යනු කුමක් ද?

භාණ්ඩාගාර බිල්පතක් යනු 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ (සංශෝධිත පරිදි) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද කෙටි කාලීන ණය උපකරණයක් වන අතර එය රජයේ අයවැය හිඟය පියවීමේ අවශ්‍යතා සඳහා යොදා ගැනේ. දින 91ණි දින 182 හා දින 364 වැනි කාලයකින් භාණ්ඩාගාර බිල්පත් කල් පිරේ.

2.3.2 භාණ්ඩාගාර බැඳුම්කරයක් යනු කුමක් ද?

භාණ්ඩාගාර බැඳුම්කරයක් යනු 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද මධ්‍යකාලීන හා දිගුකාලීන ණය මෙවලමකි.

2.3.3 රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ ක්‍රමවේදය

රජය විසින් තම සුරැකුම්පත් ප්‍රථමයෙන් නිකුත් කරනු ලබන වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළ ලෙස හැඳින්වේ. රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනය කිරීමේ දී යම්කිසි ආයෝජකයකු හට සෘජු ව ම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් මිලදී ගත නොහැකි ය. රජයේ සුරැකුම්පත් මිලදී ගත හැක්කේ මහ බැංකුව විසින් පත් කර ඇති ප්‍රාථමික අලෙවිකරුවන් හරහා පමණි. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් අදාළ සුරැකුම්පත් නිකුත් කිරීමේ වෙන්දේසියේ දී තම ආයතනය වෙනුවෙන් ලංසු ඉදිරිපත් කර සුරැකුම්පත් සෘජු ව ම මිලදී ගනු ලැබේ.

භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජනය කිරීමෙන් ඔබ හට ලැබෙන ප්‍රතිලාභ මොනවා ද?

- එලදා අනුපාතිකයන් වෙළෙඳපොළ මගින් තීරණය කරනු ලබන බැවින් ඔබට ඉහළ පොලී අනුපාතයක් ලබාගත හැකි ය.
- මෙම බිල්පත් ද්විතීයික වෙළෙඳපොළ තුළ වෙළෙඳාම් කළ හැකි බැවින් ඒවා වෙළෙඳපොළ තුළ විකිණීමෙන් ක්ෂණික ද්‍රවශීලතාව ලබා ගත හැකි ය.
- ඔබේ ආයෝජන පවත්වා ගෙන යෑම සඳහා නවීන නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය සහ ස්වයං නියම මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් ඔබට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හොඳ ම සේවාව ලබා ගත හැකි ය.

2.4 ඒකකභාර (Unit Trust)

ඒකක භාරකාර අරමුදලක් යනු ආයෝජකයින්ගේ සහ වෙනත් ගිණුම් ලැයිස්තුවල මෙන් ම ආරක්ෂිත තැන්පතුවලින් සැදුම් ලත් මුදල් සංචිතයකි. මෙම සංචිතය සඳහා විවිධ ආයෝජකයින් විසින් අරමුදල් සම්පාදනය කෙරෙයි. මෙම අරමුදලේ මුදල් විවිධ අංශවල ආයෝජනය කිරීම සිදුකෙරේ. ඒවා කොටස්, ණයකර, භාණ්ඩාගාර බිල්පත් සහ මුල්‍ය වෙළඳපොළ වශයෙන් ආයෝජනය කෙරේ. මෙහි දී ආයෝජනය සිදුකරන ස්වරූපය ඒ ඒ ආයෝජකයා ඉදිරිපත් කරන ඉල්ලීමට අනුව සිදු වෙයි. එලෙස ආයෝජනය කිරීමෙන් පසු ආයෝජකයා ලාභාංශ, පොලිය ආදී වශයෙන් ආදායම් ලබා ගනියි. මෙම ප්‍රතිලාභ වල ස්වභාවය එක් එක් ආයෝජකයා ආයෝජනය කර ඇති මුදලට අනුව වෙනස් වෙයි. මෙය ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන උපකරණයක් නිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යටතේ අධීක්ෂණය වන අතර ඒකකභාරවල ආයෝජනය කළ යුතු ආයතන ලැයිස්තුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබා ගත හැකි ය.

ඒකක භාර ආයෝජනය අඩු වියදමකින් සහ පහසුවෙන් ආයෝජනයක් කිරීමට හැකි මෙන්ම වෘත්තීය කළමනාකරණයකින් යුතු වාසි ද ලබාදේ. එමගින් ආයෝජකයාට සෑහීමකට පත් විය හැකි ප්‍රතිලාභයක් ලබා දෙයි. සෑම ශ්‍රී ලාංකිකයකුම රුපියල් 1,000 කින් හෝ රුපියල් 100,000 කින් වු ව ද ආරම්භ කළ හැකි මෙම ආයෝජනය ශක්තිමත් මූල්‍ය අනාගතයක් ගොඩනැගීමට ද වටිනා අවස්ථාවක් ආයෝජකයන්ට ලබා දෙයි.

ශ්‍රී ලංකාවේ බහුල ව දක්නට ලැබෙන ඒකක භාර වර්ග මොනවාද යන්න හඳුනා ගැනීම වැදගත් වේ. එනම් මුදල් වෙළෙඳපොළ අරමුදල් (Money Market Fund), ආදායම් අරමුදල් (Income Funds), හිමිකම් අරමුදල් (Equity Funds), සමතුලිත අරමුදල් (Balance Funds) හා ආංශික අරමුදල් (Sector Funds) ලෙස ය.

ඒකක භාරකාර අරමුදලේ වාසි මොනවාද?

- අඩු මුදලකින් අරඹිහ කිරීමේ හැකියාව. (ඔබට රු1000ක් වැනි කුඩා මුදලකින් මෙම ආයෝජනය කළ හැක)
- ඔබේ මුදල් කළමනාකරණය කිරීම පළපුරුදු අත්දැකීම් සහිත වෘත්තිකයින් පිරිසක් විසින් සිදු කිරීම.
- ද්‍රවශීලතාව (මෙය මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කිරීම කළ හැකි ය).
- බදුවලින් නිදහස් වීම.
- ආයෝජන විවිධාංගීකරණය කිරීමට අවස්ථා පැවතීම.

2.5 සාංගමික ණයකර

සාංගමික ණයකරයක් යනු නිකුතු සමාගම විසින් ආයෝජකයාට කිසියම් කාලපරිච්ඡේදයකට වරක් පොලියක් ගෙවීමට සහ/හෝ පරිණත කාලය අවසානයේ දී හෝ වෙනත් නිශ්චිත කාලයක දී මුහුණත අගය ගෙවීමට පොරොන්දුවක් සහිත ව දිගු කාලීන වශයෙන් නිකුත් කරන ණය සුරැකුම්පතකි. ණය සුරැකුම්පත් ලෙස හඳුන්වයි. මෙම ආයෝජනයේ අවදානම ප්‍රධාන වශයෙන් නිකුත් කරන ආයතනයේ අවදානම මත රඳා පවතී. සාංගමික ණයකර නිකුත් කරන්නන්ට විවිධ අවදානම් පැතිකඩ පවතින අතර ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ.

2.6 කොටස් වෙළෙඳපොළ ආයෝජනය

අනාගත මූල්‍යමය ප්‍රතිලාභ අපේක්ෂාවෙන් වර්තමානයේ කොටස් මිලදී ගැනීම සඳහා කරන වැය කිරීම කොටස් වෙළෙඳපොළ ආයෝජනයයි. කොටසක් යන්නෙන් අදහස් වන්නේ සමාගමක ආංශික අයිතිය හිමිකර දෙන්නකි. එමෙන් ම එමගින් සමාගමේ ප්‍රාග්ධනයෙන් කොටසක් නිරූපණය කරයි. ඔබ සමාගමක එක කොටසක් හෝ කොටස් කිහිපයක හිමිකරුවෙකු නම් ඔබට අදාළ සමාගමේ ආයෝජනය කිරීම හේතුවෙන් ලාභාංශ හා කොටස් මිල ඉහළ යාමෙන් ප්‍රතිලාභ හිමිවිය හැක.

කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනයේ දී දිගුකාලීන ආයෝජන ලෙස සිදු කිරීම වඩාත් ප්‍රතිඵලදායක වේ. කොටස් වෙළෙඳපොළට සම්බන්ධ කෙටිකාලීන අරමුණු මත පිහිටා කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීමට වඩා දිගුකාලීන ආයෝජනය කිරීම වඩාත් වාසිදායක ය. කොටස් වෙළෙඳපොළ තුළ කෙටි කාලීන උච්ඡාවචන සිදුවිය හැකි අතර ආයෝජකයෙකු දිගු කාලීන අරමුණු මත පිහිටා කොටස් වෙළෙඳපොළෙහි ආයෝජන කර තිබේ නම් එම කෙටි කාලීන උච්ඡාවචනයන්ට කලබල විය යුතු නැත. තව ද ආයෝජකයාට වෙළෙඳපොළ පිළිබඳ දැනුවත් භාවයක් තිබිය යුතු අතර එසේ නැතහොත් කොටස් වෙළෙඳපොළ පිළිබඳ ප්‍රමාණික දැනුමක් ඇති වෘත්තිකයකුගේ උපදෙස් ලබා ගත යුතු ය.

2.7 රක්ෂණය

රක්ෂණයක් යනු අනපේක්ෂිත උපද්‍රවයක දී මුදල් ගෙවීම මගින් ඔබව මූල්‍යමය වශයෙන් ආරක්ෂා කර ගැනීමේ ක්‍රමයකි. ජීවිත රක්ෂණය, සෞඛ්‍ය රක්ෂණයණි දේපොළ රක්ෂණය හා වගකීම් රක්ෂණය ලෙස ප්‍රධාන වශයෙන් රක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය. ජීවිත රක්ෂණයක් සෑම පුද්ගයකුට ම අතවශ්‍ය ආරක්ෂණ ආයෝජනයකි. යම්කිසි පුද්ගලයකු මියගියහොත් එම පුද්ගලයාගේ පවුලේ සාමාජිකයන්ට සුරක්ෂිත ව ජීවත්වීමට අවස්ථාව මෙම ජීවිත රක්ෂණය හරහා සැලසේ. එසේ වුවත් බොහෝ පුද්ගලයන් දේපොළ රක්ෂණය අනිවාර්යෙන් සිදුකරන අතර ජීවිත රක්ෂණයන්ට යොමු වීමේ අඩු ප්‍රවණතාවක් පවතී. එබැවින් ජීවිත රක්ෂණයක් ලබා ගැනීම අනාගත ජීවිතය සුරක්ෂිත කරගැනීම සඳහා වඩාත් යහපත් ආයෝජන උපාය මාර්ගයක් ලෙස හඳුන්වා දිය හැක. ආයෝජකයකු තම රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂණ සමාගමක් තෝරා ගැනීමේ දී රක්ෂණ ගිවිසුම හා ලැබෙන ප්‍රතිලාභත් එම රක්ෂණ සමාගම යම් අලාභයක දී රක්ෂණ ගිවිසුමට අනුව කටයුතු කර ඇති ආකාරය යනාදී කරුණුත් පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත්ය.

2.8 විශ්‍රාම සැලසුම්

රජයේ සේවකයකු නම් ඔහු හෝ ඇය විශ්‍රාම යෑමේදී විශ්‍රාම වැටුපක් හිමිවන අතර පෞද්ගලික ආයතනයක සේවය කරන්නකුට සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල පවතී. නමුත් එවැනි විශ්‍රාම සැලසුමක් නොමැති පුද්ගලයන් වෙනුවෙන් ද, විශ්‍රාම වැටුප විශ්‍රාම දිවිය ගත කිරීමට ප්‍රමාණවත් නොවන

පුද්ගලයන් වෙනුවෙන් ද විශ්‍රාම සැලසුමක් ඇති කර ගැනීම වඩාත් යෝග්‍ය ආයෝජනයකි. ඒ අනුව සෑම පුද්ගලයෙකුම තමාගේ විශ්‍රාම දිවිය සැලසුම් කිරීම අනිවාර්යයෙන් ම කළ යුත්තකි. මක්නිසාදයත් එමගින් ඔබගේ විශ්‍රාම දිවිය මූල්‍ය ස්වාධීනත්වයකින් යුතුව ගත කිරීමට අවස්ථාව සලසන නිසා ය. තරුණ වියේ දී ම විශ්‍රාම සැලසුමක් සකස් කිරීම තුළින් සාර්ථක විශ්‍රාම දිවියක් සඳහා අවශ්‍ය අඩිතාලම සැකසේ.

2.9 දේපළ ආයෝජනය

දේපළ අයෝජනය ද ඉතා ජනප්‍රිය සහ ඉතා ආකර්ෂණීය ආයෝජන විකල්පයකි, දේපළ ආයෝජන මගින් කුලී ආදායමේ ස්වරූපයෙන් නිරන්තර ආදායම් ප්‍රවාහයක් ජනනය කළ හැකි ය. එසේම සමෘද්ධිමත් දිගුකාලීන ප්‍රාග්ධන කොටස් වර්ධන විකල්ප ද ලබා දෙයි. කෙසේ වෙතත් දේපළ මිල මූලික වශයෙන් රටක පවතින අර්ථික පරිසරයණි ජනගහනයේ වෙනස්කම්ණි ජීවන රටාවල වෙනස්කම් ආදිය අනුව වෙනස් විය හැකි ය. එබැවින් දේපළවල ආයෝජනය කරන විට එහි පවතින අවදානම් තත්ත්වයන් නිසි ලෙස විග්‍රහ කිරීම අතවශ්‍ය වේ.

3. ආයෝජන තීරණ සඳහා වැදගත්වන සංකල්ප

3.1 මුදලේ කාල වටිනාකම් (Time Value of Money)

මුදලක් අද ආයෝජනය කිරීමෙන්, එය අනාගතයේ දී ලැබිය හැකි වටිනාකම ඉහළ යනු ඇත. මෙය 'මුදලේ කාලමය වටිනාකම' (Time Value of Money) යන සංකල්පය මත පදනම් වේ. ආර්ථික විශේෂඥයන් පෙන්වා දෙන්නේ, අනාගතයේ ලැබෙන මුදලක් වෙනුවට අද ම එය ලබාගැනීම වඩාත් වටිනා බවයි. මන්ද යත්, අද ලැබෙන මුදලක් ආයෝජනය කිරීමෙන් අනාගතයේ දී ඒ මුදලට අමතර ව පොලී ආදායමක් උපයා ගත හැකි ය. මුදලේ කාල වටිනාකම් වර්තමාන වටිනාකම හා අනාගත වටිනාකම ලෙස වර්ග කළ හැකි ය.

3.2 අනාගත වටිනාකම (Future Value) යනු කුමක්ද?

අද ඔබ ආයෝජනය කරන මුදලක්, නියමිත පොලී අනුපාතයකින් නියමිත කාලයක් පසුව ලැබෙන මුළු වටිනාකමක් බවයි අනාගත වටිනාකම කියන්නේ.

උදාහරණයක් ලෙස, රු. 1,000ක් 5% පොලියට අවුරුදු 2කට ආයෝජනය කළහොත්, අවුරුදු 2ක් අවසන් වනවිට ඒක රු. 1,102.50ක් වේ.

අනාගත වටිනාකම ගණනය කිරීම

අනාගත වටිනාකම ගණනය කිරීම සඳහා විශේෂ සූත්‍රයක් භාවිතා කරයි.

$$FVn = PV(1+i)^n$$

මෙහිදී,

- FVn යනු අනාගත වටිනාකම
- PV යනු දැන් ආයෝජනය කරන මුදල,
- i යනු පොලී අනුපාතයණි
- n යනු කාලය (අවුරුදු).

මෙම සූත්‍රය භාවිතයෙන් තම ආයෝජන කාලසටහන් සැලසුම් කිරීම සම්පූර්ණ කළ හැකි ය. ඉහත සමීකරණයෙන් යෙදෙන $(1+i)^n$ යන්න අනාගත වටිනාකම් පොලී සාධකය ලෙස හඳුනාගත හැකි අතර මේ සඳහා වන අගයන් විවිධ කාල සඳහා වන (විවිධ පොලී අනුපාතවලට අදාළ ව) පහත පරිදි විශ්ලේෂණාත්මක ව දැක්විය හැක.

අදාල කාලය(n)	පොලී අනුපාත			
	5%	6%	10%	15%
1	1.0500	1.0600	1.1000	1.1500
2	1.1025	1.1236	1.2100	1.3225
3	1.1576	1.1910	1.3310	1.5209
4	1.2155	1.2625	1.4041	1.7490
5	1.2763	1.3382	1.6105	2.0114

මෙවැනි වගු භාවිතයෙන් ඉතා පහසුවෙන් අනාගත අගය ගණනය කිරීමේ හැකියාව ඇත. උදාහරණයක් ලෙස ආයෝජකයකු රු1000.00 ක මුදලක් 10%ක පොලී ප්‍රතිශතයක් මත වර්ෂ 5ක කාලයක් තැන්පත් කරනු ලැබුවහොත් ආදල කාලය අවසානයේ ලැබෙන මුදල පහත සඳහන් පරිදි ගණනය කළ හැකි ය.

$FV_5 = 1000(1+i)^5$

$= 1000\ (1.6105)$

= රු. 1610.50

3.3 වර්තමාන වටිනාකම (Present Value) යනු කුමක්ද?

අනාගතයේ දී ලැබෙන මුදල් ප්‍රවාහවල අද වටිනාකම ගණනය කිරීම වර්තමාන වටිනාකම ලෙස නිර්වචනය කළ හැකි ය. මෙය ආයෝජකයන්ට ඉතා වැදගත් සංකල්පයකි. අනාගතයේ ලැබිය යුතු මුදලක් අද ලැබෙන්නේ නම් එහි වටිනාකම කීයද? යන්න සරල ව අර්ථ දැක්විය හැකි ය.

$PV = FV/(1+i)^n$

වට්ටම් සාධකය 5% නම් ආයෝජකයකුට වර්ෂ 5කට පසුව ලැබෙන රු. 10,000.00ක වර්තමාන වටිනාකම ගණනය කළ හැකි ය.

$PV = FV/(1+i)^n$

වර්තමාන වටිනාකම $= 10{,}000/(1+0.05)^5$

$= 10{,}000/1.2763$

= රු. 7835.00

එනම්, අද රු. 7,835ක් ලැබුනහොත් අවුරුදු 5කට පසුව ලැබෙන රු. 10,000කට සමාන බව අර්ථ දැක්විය හැකි ය. පහත වගුව ඇසුරින් ආයෝජකයන්ට පහසුවෙන් වර්තමාන වටිනාකම් ගණනය කිරීමේ හැකියාව ඇත.

අදාල කාලය(n)	පොලී අනුපාත			
	5%	6%	10%	15%
1	0.952	0.943	0.909	0.870
2	0.907	0.890	0.826	0.756
3	0.864	0.840	0.751	0.685
4	0.823	0.792	0.683	0.572
5	0.784	0.747	0.621	0.497

4. ආයෝජන අවදානම හඳුනාගනිමු.

ප්‍රතිලාභ වැඩි ආයෝජනයක දී ඉහළ අවදානමකට මුහුණ දීමට සිදු වීම සාමාන්‍ය තත්ත්වයක් වන අතර එය අවදානම හා ප්‍රතිලාභය අතර අනුලෝම සම්බන්ධය ලෙස හඳුනා ගත හැකි ය. ආයෝජන අවදානම අවබෝධ කරගෙන ආයෝජනයට යොමු වීම ඉතා වැදගත් ය. ඒ අනුව පහත කරුණු යටතේ ආයෝජන අවදානම හඳුනා ගත හැකි ය.

4.1 වෙළෙඳපොළ අවදානම

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සිදුවන ආර්ථික, දේශපාලන හා යුද්ධමය තත්ත්වයන් ආයෝජන කෙරෙහි සෘජු ව බලපෑම් කරයි. ඔබ කොටස්වල ආයෝජනය කරන්නේ නම් රටේ සමස්ත ආර්ථික දේශපාලන තත්ත්වය, තෙල් මිල හා යුද්ධය වැනි ලෝක සිදුවීම් පවා ඔබේ ආයෝජනයේ වටිනාකම උච්චාවචනය වීමට හේතු වන බව ආයෝජකයකු ලෙස අවබෝධ කර ගැනීම ඉතා වැදගත් ය. තව ද ඔබේ ආයෝජනයේ ගුණාත්මක භාවය එලෙස ම පැවතුන ද වෙළෙඳපොළ පහත වැටීම ආයෝජන ක්‍රියාකාරිත්වයට බාධා ඇති කරයි. උදාහරණයක් ලෙස දේපළ හොඳ ආයෝජනයක් ලෙස පෙනෙන්නට තිබේ. දේපළ මිලදී ගැනීමට වැඩි පිරිසක් උනන්දු වීම තුළින් යම් කාලයක් තුළ මිල ඉහළ ගොස් දේපළවල මිල අධිකය යන විශ්වාසය ආයෝජකයන්ට ඇතිවිය හැක. වෙළඳපොළේ අදහස් හා අපේක්ෂාවන් හදිසියේ වෙනස් වුවහොත්, මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ යා හැක.

4.2 ණය අවදානම

ණය අවදානම, පැහැර හැරීමේ අවදානම ලෙස ද හැඳින්වේ, ණය ගැණුම්කරුවෙකු හෝ ණය නිකුත් කරන්නෙකු තම ණය බැඳීම් සඳහා පොලිය සහ මූලික ගෙවීම් කාලෝචිත ලෙස සිදු කිරීමට අපොහොසත් වන නිශ්චිත ආයෝජන අවදානමයි. මෙය ආයෝජකයාට ආයෝජනය කළ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සියල්ල ම අහිමි වීමට හේතු විය හැකි ය.

4.3 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම (Liquidity Risk) යනු වත්කමක් සඳහා ක්ෂණිකව ගැනුම්කරුවන් හෝ ඉල්ලුමක් නොමැති වීමෙන් ඇතිවන අවදානමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම වත්කම විකුණන පුද්ගලයාට එය සැලකිය යුතු වට්ටමක් සහිතව (significant discount) විකිණීමට සිදුවිය හැක. උදාහරණයක් ලෙස යම් ආයෝජකයෙකුට හදිසියේ මුදල් අවශ්‍ය වී

තමන් සතු ඉඩමක් විකිණීමට අවශ්‍ය වුවද, ඒ සඳහා ක්ෂණිකව ගැනුම්කරුවන් නොමැති නම්, ඔහුට එම ඉඩම වෙළඳපොළ වටිනාකම රු. මිලියන 10ක් වුවද රු. මිලියන 8කට හෝ 7කට විකිණීමට සිදුවිය හැක. මෙය ද්‍රවශීලතා අවදානම (Liquidity Risk) සඳහා උදාහරණයකි.

4.4 උද්ධමන අවදානම

උද්ධමනය යනු රටක භාණ්ඩ හා සේවාවල පොදු මිලමට්ටම කාල පරිච්ඡේදයක් තුළ අඛණ්ඩ ව ඉහළ යාමයි. උද්ධමනය හේතුවෙන් රුපියල සතු මිලදී ගැනීමේ හැකියාව පහළ යයි. ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ උද්ධමන වේගයට වඩා අඩුනම් උද්ධමන අවදානමක් පවතී. මෙහි දී ආයෝජකයන් උද්ධමන අවදානම හඳුනාගෙන බුද්ධිමත් ආයෝජන මාර්ග තෝරා ගැනීම වැදගත් ය.නමුත් උද්ධමනය පවතින අවස්ථාවක පොළී අනුපාතික වැඩි නිසා ස්ථාවර තැන්පතුවල දිගුකාලීනව ත් ආයෝජනයත් භාණ්ඩාගාර බැදුම්කර මිලදී ගැනීමත් ආයෝජකයකුට සිදුකළ හැකි බුද්ධිමත් ආයෝජන මාර්ග වේ.

4.5 පොළී අනුපාත අවදානම

වෙළෙඳපොළ පොළී අනුපාතවල හැසිරීම ද ආයෝජනයේ අවදානම ජනනය කරයි. පොළී අනුපාත අවදානම යනු පවතින පොළී අනුපාතවල වෙනස්වීම් නිසා ඇති විය හැකි මූල්‍යමය බලපෑමයි. පොළී අනුපාත ඉහළ යන විට හෝ පහත වැටෙන විට, ණය ගැනීමේ පිරිවැය, ආයෝජන ප්‍රතිලාභ සහ වට්ටම් අනුපාත වෙනස් වන අතර එය ලාභදායිතාවයට සහ තක්සේරුවට බලපායි. පොළී අනුපාතික ඉහළ අවස්ථාවක ස්ථාවර තැන්පතු හා සුරකුම්පත් වෙළෙඳපොළ වෙත දිගුකාලීනව යොමු වීම ඉතා වැදගත් ය.

5. අයෝජන අවදානම කළමනාකරණය

ආයෝජනයේ පවතින අවදානම කළමනාකරණය කර ගැනීම සඳහා ආයෝජකයන් වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ ප්‍රමාණික දැනුවත්භාවයක් ලබා තිබීම වැදගත් වේ. එසේ ආයෝජන අවදානම කළමනාකරණය කිරීම සඳහා විෂයානුබද්ධ දැනුම කුසලතාව මෙන්ම ආකල්ප ද බෙහෙවින් ඉවහල් වේ. තව ද වෙළෙඳපොළ හැසිරවීමේ දී ආයෝජනවලින් වැඩි සඵලතාවක් ලබා ගැනීමට නම් ඒ පිළිබඳ ව්‍යාපාර දැනුමෙන් ඔබ්බට ගිය ආදාල ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රමාණික දැනුමක් ඇති අයගේ උපදේශන සේවා ලබා ගැනීම ආයෝජකයන්ට ප්‍රතිඵලදායක වේ.

එසේම අවදානම කළමනාකරණයේ දී, තම ආයෝජන කළඹක් ලෙස පවත්වා ගැනීම ඉතා ප්‍රතිඵලදායී උපක්‍රමයකි. ආයෝජන කළඹක් යනු කෙනෙකු හෝ ආයතනයක් තම ධනය ආයෝජන මාර්ග කිහිපයක යෙදවීමයි. මෙය අපි අයෝජන විවිධාංගීකරණය ලෙස ද හඳුන්වමු. එක ආයෝජනයක මුදල් යෙදවීමේ දී එම ආයෝජනය අසාර්ථක වුවහොත් සමස්ත ධනය අහිමි වීමේ අවදානමෙන් මිදීම සඳහා කළඹ ආයෝජන යොදා ගත හැකි ය. කළඹ ආයෝජනයේ ඇති තවත් වැදගත් ලක්ෂණයක් වනුයේ ආදායම් විවිධාංගීකරණයයි. කොටස්, ඉඩම්, බැදුම්කර ආදියෙහි ආයෝජනයෙන් ලැබෙන ආදායම් වෙනස් වීම නිසා මුළු ආදායම් ස්ථාවර ව පවත්වා ගැනීමට හැකිවීමත් එමගින් පුද්ගල මූල්‍ය ස්වාධීනත්වය ලබා ගත හැකි වීමත් නිසා දිගුකාලීන වශයෙන් ආයෝජකයාගේ ජීවන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය අරක්ෂාව නිතැතින් ම හිමිවේ. වෙළෙඳපෙළ සහ ආර්ථික තත්ත්වය අනුව ආයෝජන කළඹ යාවත්කලීන කිරීම ඉතා අවශ්‍ය හා කල්පනාකාරී ව කළ යුතු දෙයකි. මෙසේ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සකස් කිරීමෙන් සිය මුදල් අලාභවලින් රැක ගැනීම, ආදායම් විවිධාංගීකරණය, දිගුකාලීන ආරක්ෂාව සහ වෙළෙඳපොළ තත්ත්වයට ගැලපෙන සුරක්ෂිතාව ලැබෙන අතර, පුද්ගල මට්ටමින් සහ ජාතික මට්ටමින් ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැගීම සඳහා මහත් උපකාරයක් වේ.

6. සාරාංශය

ආයෝජනය යනු වත්මන් මුදල් සම්පත් අනාගත ආදායමක් හෝ ප්‍රතිලාභයක් ලබා ගැනීමේ අරමුණින් යෙදවීමක් වන අතර, පුද්ගලයන්ගේ මූල්‍ය ආරක්ෂාව සහ දිගුකාලීන ජීවිත ඉලක්ක සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය මූල්‍ය මෙවලමක් ලෙස සැලකේ. පුද්ගලයන් සතු ව ඇති ආදායම නිසි පරිදි කළමනාකරණය කිරීමත්ණි මූල්‍ය ඉලක්ක අනුව සුදුසු ආයෝජන ක්‍රමවේද තෝරා ගැනීමත් මඟින් ඔවුන්ගේ ජීවිතය තුළ මුළුමනින් ම ආර්ථික ස්ථාවරභාවයක් පවත්වාගෙන යාමට අවස්ථාව ලබාදේ.

ආයෝජන තීරණ ගැනීමේ දී මුදලේ කාල වටිනාකම පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබිය යුතු අතර,

ආයෝජන අවදානම් සහ ලැබිය හැකි ප්‍රතිලාභ නිවැරදිව තක්සේරු කරමින් ආයෝජන සැලසුම් කළ යුතු ය. අනාගත ආදායම, අර්බුද අවස්ථා, අනපේක්ෂිත වියදම් සහ විශ්‍රාම අවස්ථා සඳහා මූල්‍ය සූදානම් වීම කෙරෙහි ආයෝජන ක්‍රියාවලිය ඉලක්ක කල යුතු ය.

එසේ ම, ආයෝජනයන් මඟින් පුද්ගලයන්ගේ පෞද්ගලික ජීවිතයට පමණක් නොව, රටේ ආර්ථිකයට ද දැවැන්ත දායකත්වයක් ලබාදිය හැකි වේ. ආයෝජන ක්‍රියාවලිය මඟින් මූල්‍ය වෙළෙඳපොළට ලැබෙන අරමුදල් යොදාගනිමින් නව ව්‍යාපාර ආරම්භ කිරීම, කර්මාන්තශාලා සවිබල ගැන්වීම, රැකියා අවස්ථා බිහි කිරීම හරහා ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සිදු කළ හැකි ය.

තවද, ආයෝජන තීරණ ගැනීමේ දී, වෙළෙඳපොළ තත්ත්වය, ආර්ථික පරිසරය, පොලී අනුපාතය, ආර්ථිකයේ නව ප්‍රවණතා, නීතිමය පරිසරය සහ ජාත්‍යන්තර අර්ථික සිදුවීම් පවා සලකා බැලීම ආයෝජකයාගේ වගකීමකි. මේ සඳහා මූල්‍ය ලෝකයේ නවීන තොරතුරු, ගනුදෙනු රටා, සහ නව ආයෝජන අවස්ථා පිළිබඳ දැනුවත් වීම වැදගත් ය. විශේෂයෙන් ම, වත්මන් යුගයේ ආයෝජන අවදානම් බහුල වීම හේතුවෙන් කළඹ ආයෝජන ක්‍රම භාවිත කිරීම මගින් අවදානම් අඩු කරමින් ආදායම් මාර්ග විවිධාංගීකරණය කර ගැනීම බුද්ධිමත් ක්‍රමයක් වේ.

බුද්ධිමත් ලෙස ආයෝජන අවස්ථා තෝරා ගැනීමෙන් පුද්ගලයාගේ මුදල් ආරක්ෂාව පමණක් නොව, සුවපහසු විශ්‍රාම දිවියක්, දරුවන්ගේ අනාගත අධ්‍යාපන කටයුතු සඳහා මූලධනයක්, නව ව්‍යාපාර ආරම්භ කිරීමේ අරමුදල්, විදේශ සංචාර, නිවසක් සහ වාහනයක් මිලදී ගැනීම වැනි ජීවිතයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහාත් බෙහෙවින් හැකියාව ලැබේ.

රටේ ජනතාවගේ මූල්‍ය දැනුම වර්ධනය කිරීම සඳහා ඉතිරිකිරීම පමණක් නොව, ආයෝජනයේ වැදගත්කම පිළිබඳ අවබෝධය ජනතාව අතර වර්ධනය කිරීම ද අවශ්‍යය. සමාජය තුළ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කරමින් ආයෝජන අවස්ථා හඳුන්වා දීම හා ජනතාවට සුදුසු මඟ පෙන්වීම් ලබාදීම මූල්‍ය ආරක්ෂාව සහ ආර්ථික ස්වයංපෝෂිතතාව වර්ධනයට මඟ පෙන්වයි.

පුද්ගලයෙකු තමන්ගේ ආදායම, වියදම් සහ ඉතිරිකිරීම් නිවැරදි ව සැලසුම් කරමින් බුද්ධිමත් ආයෝජන තීරණ ගැනීම ඔහුගේ දිගුකාලීන මූල්‍ය ඉලක්ක ඉටු කර ගැනීම සඳහා පමණක් නොව ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේදී ද දැවැන්ත දායකත්වයක් ලබා දෙන බව අවසන් වශයෙන් සඳහන් කළ යුතු ය.

ඩිජිටල් ගෙවීම් වර්ධනය කිරීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස මූල්‍ය තාක්ෂණයේ (ෆින්ටෙක්) භාවිතය

එම්. කේ. ටී. එන්. හංසි
ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව

හැඳින්වීම

ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් මූල්‍ය සේවා සඳහා විසඳුම් සැපයීම, ෆින්ටෙක් ලෙස හැඳින්විය හැකිය. මේ වනවිට ගෝලීය මූල්‍ය පද්ධතියට ප්‍රබල බලපෑමක් ඇති කරමින්, මූල්‍ය සේවා සැපයීමේ ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස වෙනස් කිරීම සඳහා ෆින්ටෙක් විශාල දායකත්වයක් දක්වයි. ඩිජිටල් ගෙවීම්වල වේගවත් වර්ධනයට ෆින්ටෙක් නවෝත්පාදනයන් බෙහෙවින් දායක වෙමින් පවතින අතර, 2017 වසරේ දී නැගී එන හා සංවර්ධනය වෙමින් පවතින රටවල එක් වැඩිහිටියෙකු සිදුකළ ඩිජිටල් ගනුදෙනු සංඛ්‍යාව 55 ක් වූ අතර 2024 වසර වන විට එම අගය ඩිජිටල් ගනුදෙනු 251 දක්වා ඉහළ යාමෙන් ඒ බව මනාව පැහැදිලි වේ (Fareed, et al., 2025). ෆින්ටෙක් සමාගම් විසින් විද්‍යුත් මුදල් පසුම්බි (mobile wallets), ක්ෂණික ප්‍රතිචාර (QR) කේත මත පදනම් වූ ගෙවීම් පද්ධති, ජංගම දුරකථන පදනම් කර ගත් ගෙවීම් යෙදවුම් (mobile banking applicatɥons), අන්තර්ජාල බැංකුකරණ වේදිකාවන් (internet banking platforms), ගෙවීම් ද්වාර (payment gateways) සහ රජය මගින් මෙහෙයවනු ලබන ගෙවීම් වේදිකා වැනි විවිධාකාර නවෝත්පාදනීය ගෙවීම් විසඳුම් හඳුන්වා දී ඇත.

ෆින්ටෙක් මත පදනම් වූ ඩිජිටල් ගෙවීම් වලින් ලැබෙන ප්‍රතිලාභ

ෆින්ටෙක් මගින් නිර්මාණය කරනු ලබන ඩිජිටල් ගෙවීම් ක්‍රම, මුදල් සහ පැරණි ගෙවීම් යටිතල පහසුකම් මත රඳා පැවැත්ම සැලකිය යුතු ලෙස අඩු කර ඇති අතර, ගනුදෙනුවල වේගවත්බව සහ ආරක්ෂාව වැඩිදියුණු කරමින්, ගනුදෙනු සඳහා වැයවන පිරිවැය පහත දමා, පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල සමස්ත පහසුව වැඩිදියුණු කර ඇත (B¸S, 2018).

තවද, ෆින්ටෙක් භාවිතය මගින් ඉහළ යන විමධ්‍යගත කිරීම හා විවිධාංගීකරණය හේතුවෙන් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ කාර්යක්ෂමතාව ශක්තිමත් වේ. විශාල පරාසයක් තුළ ඩිජිටල් ගෙවීම් වේදිකා සහ සේවා සැපයුම්කරුවන් බල ගැන්වීම මගින්, මූල්‍ය පද්ධතිය තුල ඇතිවිය හැකි අවදානම් අඩු කරමින්, මූල්‍ය කම්පනවල බලපෑම අවම කර, සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය තවදුරටත් ශක්තිමත් කළ හැක. (FSB, 2017).

විශේෂයෙන් ම, ෆින්ටෙක් මාර්ගයෙන් ඩිජිටල් ගෙවීම්වල තාක්ෂණික මෙහෙයවීම සිදු වන අතර, එය මූල්‍ය සේවාවන්ට පවතින ප්‍රවේශය පුළුල් කරමින් ගෝලීය මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ප්‍රධාන මාවත ලෙස ක්‍රියා කරයි. 2011 වසරේ දී සියයට 51 ක් වූ ගෝලීය ගිණුම් හිමිකාරීත්වය 2024 වසර වන විට සියයට 79 ක් දක්වා ඉහළ යාමට ඩිජිටල් සම්බන්ධතාවයේ ව්‍යාප්තිය සැලකිය යුතු ලෙස දායක වී ඇත. මෙය විශාල වශයෙන් ජංගම දුරකථන හිමිකාරීත්වයේ ව්‍යාප්තියෙන් සහාය ලැබූ ජංගම දුරකථන පදනම් කරගත් මූල්‍ය විසඳුම් මඟින් මෙහෙයවනු ලැබ ඇත (Klapper, et al., 2025). එමඟින්, ගෘහස්ථ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) අතර මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කරමින්, ප්‍රතිලාභ සියලු දෙනා වෙත සමසේ බෙදී යන තිරසාර ආර්ථික වර්ධනයට සහාය දක්වනු ලබයි.

ඩිජිටල් ගෙවීම් පද්ධතිවල ගෝලීය ආකෘතීන්

බොහෝ රටවල් ෆින්ටෙක් මඟින් මෙහෙයවනු ලබන සාර්ථක ඩිජිටල් ගෙවීම් පද්ධති ක්‍රියාත්මක කර ඇත. සමාන තත්වයේ රටවල් අතරින්, නේපාලයේ විශාලතම අන්තර්ක්‍රියාකාරී ගෙවීම් ජාලය වන Fonepay, නේපාල මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන අතර, මූල්‍ය ආයතන 60 කට වැඩි සංඛ්‍යාවක්, මිලියන 20 කට අධික පරිශීලකයින් පිරිසක් සහ මිලියන 1.7 කට අධික වෙළඳුන් පිරිසක් සමඟ සම්බන්ධ වේ. Fonepay හි වේගවත් වර්ධනය සහ පුළුල් භාවිතය ඉස්මතු කරමින්, 2025 මාර්තු 30 දින දෛනික QR ගනුදෙනු සංඛ්‍යාව මිලියනය ඉක්මවා ගොස් ඇති අතර, සමස්ත ගනුදෙනු වටිනාකම නේපාල රුපියල් බිලියන 2.62 ක් ලෙස වාර්තා විය (Anon., 2025). තවද, 2016 දී හඳුන්වා දෙන ලද ඉන්දියාවේ ඒකාබද්ධ ගෙවීම් අතුරුමුහුණත (Unified Payments Interface - UP¸), මුදල් භාවිතය මත පදනම්වීම සැලකිය යුතු ලෙස අඩු කරමින් වේගයෙන් වර්ධනය වී ඇත. වර්තමානයේ, PhonePe වැනි වේදිකා සහ අනෙකුත් ෆින්ටෙක් සහ බැංකු ගෙවීම් යෙදවුම් හරහා UPI මඟින් මාසිකව ගනුදෙනු බිලියන 18 කට අධික සංඛ්‍යාවක් සිදු කරන අතර, අනෙකුත් ගෝලීය විද්‍යුත් ගෙවීම් පද්ධති අභිබවා, ඉන්දියාව ක්ෂණික ගෙවීම් ක්ෂේත්‍රයේ ගෝලීය පුරෝගාමියා බවට පත්වී ඇත (Copestake, et al., 2025). ඉන්දියාවේ ෆින්ටෙක් සහ මූල්‍ය අන්තර්ගතභාවය යන මාතෘකාව ඔස්සේ Khurana et al. (2025) සිදුකළ විමර්ශනයට අනුව, ඩිජිටල් ගෙවීම් භාවිතය ඉන්දියාවේ මූල්‍ය අන්තර්ගතභාවය සමඟ දැඩිව සම්බන්ධ වන අතර, එම භාවිතය සියයට 10 කින් වැඩිවීම, මූල්‍ය අන්තර්ගතභාව දර්ශකයේ ආසන්න වශයෙන් සියයට 7.8 ක වැඩිවීමකට හේතු වේ. තවද, මෙම අධ්‍යයනය, ග්‍රාමීය ප්‍රදේශ ඉලක්ක කරගත් UP¸ මඟින් බල ගන්වන ලද බැංකු සේවා වල ප්‍රවේශයේ ව්‍යාප්තිය වැඩිකිරීම මඟින්, මූල්‍ය අන්තර්ගතභාවයයේ පරතරය සැලකිය යුතු ලෙස අඩු කළ හැකි බවද පෙන්වා දෙයි. මේ අතර, චීනයේ Alipay සහ WeChat Pay වැනි ගෙවීම් වේදිකාවල භාවිතය මඟින් සනාථ වන පරිදි, ෆින්ටෙක් යොදාගැනීමෙන් එරට තුළ උසස් ඩිජිටල් ගෙවීම් පද්ධතියක් නිර්මාණය වී ඇත. එසේම, කෙන්යාවේ භාවිතා වන ප්‍රධාන ජංගම විද්‍යුත් මුදල් සේවාව (e-Money Service) වන M-Pesa (M-Mobile, Pesa-Money) පදනම් කරගත් ෆින්ටෙක් විසඳුම් මඟින් එරට මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමටත්, දිළිඳුකම අඩු කිරීමටත් හැකියාව ලැබී ඇත. (Fareed, et al., 2025).

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ගෙවීම්වල වර්ධනය

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුලිකත්වයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සහ අධීක්ෂණය සමඟ තාක්ෂණයේ දියුණුව නිසා ඇති වූ ෆින්ටෙක් ක්ෂේත්‍රයේ වර්ධනය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ඩිජිටල් ගෙවීම්වල භාවිතය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මෙය මුදල් භාවිතය මත පදනම්වීම අඩු කරමින්, ආරක්ෂිත, කාර්යක්ෂම සහ පිරිවැය ඵලදායි ඩිජිටල් ගෙවීම් විසඳුම්වලට ප්‍රවේශය වැඩි කර ඇත. තවද, ප්‍රධාන වශයෙන් 2025 වසර අවසානය වන විට ඉහළ අන්තර්ජාල ඝනත්වය (පුද්ගලයන් 100කට 110ක්) සහ ජංගම දුරකථන ඝනත්වය (පුද්ගලයන් 100කට 136ක්) වැනි සන්නිවේදන යටිතල පහසුකම්වල ව්‍යාප්තිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ෆින්ටෙක් ක්ෂේත්‍රයේ වර්ධනය වේගවත් වී ඇති අතර, සියලු දෙනාට ප්‍රවේශ විය හැකි වඩාත් ඩිජිටල්කරණය වූ මූල්‍ය පද්ධතියක් නිර්මාණය වී ඇත.

ශ්‍රී ලංකාවේ ෆින්ටෙක් පද්ධතිය තුළ ප්‍රමුඛ අංශය නියෝජනය කරන්නේ ඩිජිටල් ගෙවීම් ය. 2015 වසරේ දී හඳුන්වා දෙන ලද විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), තත්කාලීන අන්තර්බැංකු ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් භූමිකාවක් ඉටු කර ඇති අතර, JustPay, LANKAQR, ලංකාපේ

මංගත ගෙවීම් වේදිකාව (LPOPP) සහ Go¶Pay වැනි ෆින්ටෙක් මඟින් බල ගන්වන ලද ගෙවීම් ක්‍රම සඳහා පදනම සපයමින්, ක්ෂණික ගෙවීම් සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කර ඇත. මෙය, ගෙවීම් සේවා සැපයුම්කරු කවුරුන් වුවද, ෆින්ටෙක් සහ බැංකු යෙදුම් ඇතුළු අන්තර්ක්‍රියාකාරී ගෙවීම් යෙදුම් භාවිතයෙන්, බැංකු අතර බාධාවකින් තොරව මුදල් හුවමාරු කිරීමට පාරිභෝගිකයින්ට හැකියාව සලසයි. 2025 වසරේ දී, CEFTS මඟින් රුපියල් ට්‍රිලියන 23.1 ක සමස්ත වටිනාකමකින් යුතු ගනුදෙනු මිලියන 260 කට අධික සංඛ්‍යාවක් සිදුකර ඇති කර ඇති අතර එය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 70 කට වැඩි ප්‍රමාණයකට සමාන වේ. 2020 වසරේ දී එම මට්ටම සියයට 15.4 ක් වූ අතර සුළු පරිමාණ ගෙවීම් ක්ෂේත්‍රයේ ඉහළ යමින් පවතින වැදගත්කම එයින් අවධාරණය කරයි. LANKAQR මඟින් පද්ධති අතර අන්තර්ක්‍රියාකාරී බව ඉහළ නංවා, බැංකු සහ ෆින්ටෙක් වේදිකා අතර අඩු පිරිවැයකින් යුත් ඩිජිටල් ගනුදෙනු බල ගන්වා ඇති නිසා සාම්ප්‍රදායික විකුණුම් පළ ගෙවීම් (Point of Sale) යටිතල පහසුකම්වලට, වඩා ලාභදායී විකල්පයක් ලෙස කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර වෙත ප්‍රතිලාභ ලබා දෙයි. මේ අතර, GovPay වැනි පියවර මඟින් කාර්යක්ෂම හා විනිවිද බවින් යුතු රාජ්‍ය සේවා ගෙවීම් බල ගන්වමින් ඩිජිටල් ගෙවීම් පද්ධතිය තවදුරටත් ශක්තිමත් කර ඇත. එම පියවර මඟින්, විශේෂයෙන්ම බැංකු සේවා නොලබන (unbanked) සහ ප්‍රමාණවත් ලෙස බැංකු සේවා නොලබන (underbanked) ජනතාව අතර මූල්‍ය ප්‍රවේශය පුළුල් කරයි. තවද, මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව මූල්‍ය තාක්ෂණයන් පරීක්ෂා කිරීම සහ දියුණු කිරීම සඳහා පාලිත පරිසරයක් සපයාදෙන සිය නියාමන පරීක්ෂණ අවකාශය (Regulatory Sandbo·) ෆින්ටෙක් නව නිර්මාණයන් සඳහා පහසුකම් සලසයි.

නිගමනය

සාම්ප්‍රදායික මූල්‍ය පද්ධති වැඩි කාර්යක්ෂම, ආරක්ෂිත, පිරිවැය ඵලදායි සහ සියලු දෙනා ඇතුළත් වන පද්ධතියක් බවට පරිවර්තනය කරමින්, මුදල් භාවිතය අඩු ආර්ථිකයක් වෙත සංක්‍රමණය වීමට පහසුකම් සලසමින්, ෆින්ටෙක්, ඩිජිටල් ගෙවීම්වල වර්ධනය සඳහා ශක්තිමත් ප්‍රවර්ධකයක් ලෙස ඉස්මතු වී ඇත. කෙසේ වෙතත්, අන්තර්ක්‍රියාකාරීබව, රාජ්‍ය හා පුද්ගලික දෙඅංශයේම සහභාගීත්වය සහ පවතින ගෙවීම් යටිතල පහසුකම් සමඟ කාර්යක්ෂම සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කරමින්, ෆින්ටෙක් මඟින් මෙහෙයවනු ලබන ඩිජිටල් ගෙවීම් සඳහා සයිබර් ආරක්ෂාව සම්බන්ධ අවදානම් අවම කිරීම, පාරිභෝගික ආරක්ෂාව හා දත්ත රහස්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා, මනාව ගැලපෙන නියාමන රාමුවක් සහ ආරක්ෂණ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. තවද, ෆින්ටෙක් මඟින් මෙහෙයවනු ලබන ගෙවීම් වල, මූල්‍ය ප්‍රවේශය පුළුල් කිරීම සහ තිරසාර ආර්ථික වර්ධනයට හා මූල්‍ය ස්ථාවරතාවය සඳහා සහාය දීමේ භූමිකාව ශක්තිමත් කිරීම සඳහා පවතින යටිතල පහසුකම් සීමා සහ මූල්‍ය දැනුම් හිඟතාවය සම්බන්ධ ගැටලු විසඳීම අත්‍යවශ්‍ය වේ.

References

Anon., 2025. fonepay.com. [Online]

Available at: https://fonepay.com/blogs/Fonepay-QR-1-Million-transactions

Arner, D. W., Barberis, J. N. & P. Buckley, R., 2015. Paradigm?, The Evolution of Fintech: A New Post-Crisis Paradigm?. University of Hong Kong Faculty of Law Research Paper No. 2015/047, 20 October .

BIS, 2018. Sound Practices Implications of fintech developments for banks and bank supervisors, Basel: Bank for International Settlements.

Copestake, A., Kirti, D. & Peria, M. S. M., 2025. FinTech Note : Growing Retail Digital Payments The Value of Interoperability, Washington, DC: International Monetary Fund.

Fareed, F., Huayta-Zapata, K., Nguyen-Xuan, D. & Segoviano, M., 2025. Financial Access Survey (FAS), Washington, D.C: International Monetary Fund.

FSB, 2017. Financial Stability Implications from FinTech, Basel: Financial Stability Board.

Khurana, L. et al., 2025. Fintech And Financial Inclusion In India: A Data-Driven Analysis Of Digital Payments And Banking Access. Journal of Informatics Education and Research.

Klapper, L., Singer, D., Starita, L. & Norris, A., 2025. The Global Findex Database 2025: Connectivity and Financial Inclusion in the Digital Economy, Washington, DC: World Bank Publications.